# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය විශාල පසුබෑමකට ලක් වූ අතර, එම තත්ත්වය හමුවේ රජය සහ මහ බැංකුව විසින් කඩිනම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබීම අවශ්‍ය විය. වෛරසය ව්‍යාප්ත වීම හා එය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග වඩා තීව්‍ර වූ මාසවල දී වෙළඳ භාණ්ඩ අපනයනය තියුණු ලෙස පහළ ගිය නමුත්, අපේක්ෂා කළ කාලයට පෙර පූර්ව වසංගත මට්ටමට ළඟා විය. අත්‍යවශ්‍ය නොවන ආනයන බොහොමයක් සීමා කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහ බොරතෙල් මිල අඩුමට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ දී සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළේය. භාණ්ඩ අපනයන ඉපැයීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමේ සහ භාණ්ඩ ආනයන වියදම අඛණ්ඩව අඩු වීමේ ඒකාබද්ධ බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එය 2010 වසරෙන් පසු මේ දක්වා වාර්තා වූ අඩුම වෙළඳ හිඟය වේ. ලොව පුරා හුදකලා කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමත්, සංචාරකයින් සඳහා රටේ දේශ සීමා 2020 වසරේ මාර්තු මාසයේ මැද සිට වසා දැමීමත් හේතුවෙන් සංචාරක අංශය අකර්මන්‍ය විය. කෙසේ වෙතත්, වසංගතය ආශ්‍රිතව එල්ල වූ බාධාවන්ගෙන් පසු සංචාරක කටයුතු සඳහා දේශ සීමා විවෘත කළ ආසියාවේ රටවල් කිහිපයෙන් එකක් ලෙස ශ්‍රී ලංකාව 2021 වසරේ ජනවාරි මාසයේ සිට සංචාරකයින් සඳහා සිය දේශ සීමා විවෘත කළේය. සේවා අංශය වෙත වන අනෙකුත් ලැබීම්, විශේෂයෙන් මුහුදු හා ගුවන් කුලී සේවා ලැබීම් මන්දගාමී වූ නමුත්, නව සාමාන්‍ය තත්ත්වය විසින් නිර්මාණය කරන ලද ප්‍රවණතා සමඟ 2020 වසරේ දී පරිගණක සේවා අංශයේ කැපී පෙනෙන වර්ධනයක් නිරීක්ෂණය කෙරිණි. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වසංගතයේ මුල් මාසවල දී අඩු වීමක් වාර්තා කිරීමෙන් පසු අපේක්ෂා කළ කාලයට පෙර යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් වසර තුළ දී සමස්ත වර්ධනයක් වාර්තා කළේය. විදේශිකයින් සතු රාජ්‍ය සුරැකුම්පත් සඳහා පොලී සහ කූපන ගෙවීම් අඩුවීමත්, සෘජු ආයෝජන ව්‍යාපාර විසින් සිදු කරන ලද ලාභාංශ ගෙවීම් හා ප්‍රතිආයෝජිත ඉපැයීම් අඩු වීමත් සමඟ 2020 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් අඩු විය. මෙම ප්‍රවණතා හේතුවෙන් 2020 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 1.1ක් දක්වා අඩු වූ අතර, එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.3ක් විය. අවිනිශ්චිතතාවයන් ඉහළ යෑමත් සමඟ 2020 වසරේ දී සීමිත විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණයක් වාර්තා වූ අතර, සාපේක්ෂව අඩු එම ලැබීම් දැනට ආරම්භ කර ඇති ව්‍යාපෘති මත සිදු

5

කෙරුණු ආයෝජන විය. මේ අතර, වසංගත තත්ත්වය හේතුවෙන්, ගෝලීය මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ කැලඹීම් හමුවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ගෙවීම් වාර්තා විය. විනිමය අනුපාතිකය 2020 වසරේ දී අවප්‍රමාණය වූ නමුත්, මාර්තු සහ අප්‍රේල් මාසවල දී සහ නොවැම්බර් මාසය අග සිට වරින් වර දැකිය හැකි වූ විචලනයන් හැරුණු විට, සාපේක්ෂව ස්ථාවරව පැවතුණි. විනිමය අනුපාතිකයේ විචලනයන් පැවති කාලපරිච්ඡේදයන්හි දී මහ බැංකුව විදේශ විනිමය සැපයීම සහ අන්තර් බැංකු විකුණුම්-මිලදී ගැනීම් ආකාරයේ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සිදු කරමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සක්‍රියව මැදිහත් විය. කෙසේ වෙතත්, 2020 වසරේ දී ශුද්ධ පදනම මත දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට මහ බැංකුවට හැකි විය. විදේශීය ණය ගැනීම් සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත පිවිසීම සම්බන්ධයෙන් බාධක පැවතිය ද, ශ්‍රී ලංකාව ණය සේවාකරණය කිරීම පිළිබඳ වූ නොබිඳුනු වාර්තාව තවදුරටත් පවත්වා ගෙන ගියේය. කෙසේ වුව ද, ඉදිරි වසර කිහිපයේ සෑම වසරකදී ම සිදු කළ යුතු ඉහළ ණය සේවාකරණ ගෙවීම් තවදුරටත් අභියෝගයක් ව පවතී. මෙම අභියෝගය හඳුනා ගනිමින්, අඛණ්ඩව විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සහතික කිරීම සහ රටේ විදේශීය ණය බර ක්‍රමයෙන් අඩු කිරීම අරමුණු කර ගනිමින්, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ණයබර ඇති නොකරන විදේශ විනිමය ගලා ඒම වැඩිදියුණු කිරීම අරමුණු කර ගත් ඉලක්කගත වැඩසටහනක් රාජ්‍ය හා පෞද්ගලික අංශ සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එය විදේශීය අංශය ශක්තිමත් කිරීම සඳහා රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය වේ. රජයේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට අනුකූලව සැලසුම් කර ඇති පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම තුළින් රාජ්‍ය මූල්‍ය හිඟයයන් අධික ලෙස ප්‍රසාරණය වීම හේතුවෙන් ගෙවුම් තුලනය මත ඇති කරනු ලබන බලපෑම අඩු වනු ඇතැයි ද, එමගින් ඉදිරි කාල සීමාව තුළ විදේශීය අංශයේ ස්ථාවරත්වය ඉහළ නැංවෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2019 (අ) | 2020 (ආ) | 2019 (අ) | 2020 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-1,843** | **-1,083** | **-330,114** | **-220,370** |
| **වෙළඳ ගිණුම** | **-7,997** | **-6,008** | **-1,430,232** | **-1,115,988** |
| අපනයන | 11,940 | 10,047 | 2,134,796 | 1,858,927 |
| ආනයන | 19,937 | 16,055 | 3,565,028 | 2,974,915 |
| **සේවා (ශුද්ධ)** | **2,849** | **819** | **510,822** | **150,014** |
| ලැබීම් | 7,474 | 3,035 | 1,337,540 | 559,615 |
| ගෙවීම් | 4,625 | 2,216 | 826,718 | 409,601 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,462** | **-2,101** | **-441,394** | **-405,184** |
| ලැබීම් | 252 | 198 | 44,989 | 36,766 |
| ගෙවීම් | 2,713 | 2,300 | 486,383 | 441,951 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **5,766** | **6,207** | **1,030,690** | **1,150,789** |
| ද්විතීයික ආදායම්: ලැබීම් | 6,726 | 7,117 | 1,202,334 | 1,319,377 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,717 | 7,104 | 1,200,766 | 1,317,007 |
| රජයේ සංක්‍රාම | 9 | 13 | 1,568 | 2,371 |
| ද්විතීයික ආදායම්: ගෙවීම් | 960 | 910 | 171,644 | 168,589 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **23** | **28** | **4,095** | **5,193** |
| ප්‍රාග්ධන ගිණුම: ලැබීම් | 51 | 51 | 9,054 | 9,472 |
| ප්‍රාග්ධන ගිණුම: ගෙවීම් | 28 | 23 | 4,959 | 4,279 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,820** | **-1,055** | **-326,019** | **-215,178** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,460** | **-260** | **-441,794** | **-52,625** |
| **සෘජු ආයෝජන: වත්කම්** | **77** | **15** | **13,830** | **2,699** |
| **සෘජු ආයෝජන: වගකීම්** | **743** | **434** | **132,916** | **80,556** |
| **විවිධ ආයෝජන: වත්කම්** | - | - | - | - |
| **විවිධ ආයෝජන: වගකීම්** | **2,313** | **-2,383** | **408,854** | **-441,886** |
| හිමිකම් | -4 | -217 | -1,106 | -40,187 |
| ණය සුරැකුම්පත් | 2,317 | -2,166 | 409,960 | -401,700 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන: වත්කම්** | **100** | **-136** | **17,823** | **-27,446** |
| මුදල් සහ තැන්පතු | -93 | 64 | -16,796 | 11,666 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -4 | -224 | -680 | -41,647 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 196 | 24 | 35,299 | 2,535 |
| **අනෙකුත් ආයෝජන: වගකීම්** | **-82** | **383** | **-12,878** | **66,980** |
| මුදල් සහ තැන්පතු | 167 | -15 | 31,079 | -3,519 |
| ණය | -245 | 327 | -43,494 | 57,980 |
| මහ බැංකුව | 327 | -14 | 58,277 | -2,689 |
| තැන්පතු භාරගන්නා ආයතන | -281 | 75 | -50,904 | 10,390 |
| රජය | -89 | 169 | -14,387 | 31,961 |
| අනෙකුත් අංශ | -203 | 96 | -36,479 | 18,319 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -28 | 185 | -5,577 | 32,565 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 24 | -114 | 5,114 | -20,046 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **337** | **-1,704** | **55,445** | **-322,229** |
| මූල්‍ය රත්‍රන් | -14 | -667 | -2,614 | -123,485 |
| විශේෂ ගැනුම් හිමිකම් | 6 | -5 | 1,080 | -825 |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 346 | -1,032 | 56,979 | -197,919 |
| මුදල් සහ තැන්පතු | 361 | -177 | 59,518 | -37,326 |
| සුරැකුම්පත් | -19 | -856 | -3,039 | -160,807 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-640** | **795** | **-115,775** | **162,553** |
| **සමස්ත ශේෂය (ඇ)** | **377** | **-2,328** | **62,296** | **-405,854** |
| **ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -9.5 | -7.4 | | |
| භාණ්ඩ හා සේවා | -6.1 | -6.4 | | |
| ජංගම ගිණුම | -2.2 | -1.3 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -2.2 | -1.3 | | |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.11 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.1 රූප සටහන
### විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය




5

### 5.2 රූප සටහන
### ගෙවුම් තුලනය



මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2 ජංගම ගිණුමේ ශේෂය

සේවා ගිණුමේ අතිරික්තය කැපී පෙනෙන ලෙස පහළ ගිය ද, වෙළඳ හිඟය අඩු වීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීම සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2020 වසරේ දී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පහළ ගියේය. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම සහ බොරතෙල් මිල ගණන් අඩු වීම හමුවේ ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් බිලියන 2.0කින් පමණ අඩු විය. තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ සේවාවන්ගේ ඉහළ ලැබීම් දක්නට හැකි වුව ද, සංචාරක කර්මාන්තය අකර්මන්‍ය වීම සහ ගුවන් සහ මුහුදු කුලී ප්‍රවාහන සේවාවන්ට සිදුවූ බාධා හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස පහළ ගියේය. රාජ්‍ය සුරැකුම්පත් වෙත වූ විදේශීය ආයෝජන සඳහා පොලී සහ කූපන ගෙවීම් පහළ යෑම සහ සෘජු ආයෝජන ව්‍යාපාරවල ලාභාංශ ගෙවීම් හා ප්‍රතිආයෝජිත ඉපැයීම් පහළ යෑම සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු විය. ප්‍රධාන වශයෙන් 2020 වසරේ දෙවන භාගයේ දී අපේක්ෂිත මට්ටමට වඩා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යෑම සමඟ ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් වර්ධනය විය. මෙම ප්‍රවණතා හමුවේ, විදේශීය ජංගම ගිණුමේ හිඟය 2019 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 1.8ක සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.1ක් දක්වා අඩු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී සියයට 1.3ක් වූ අතර, එය 2019 වසරේ දී සියයට 2.2ක් විය.

### 5.2 සංඛ්‍යා සටහන
### ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2019 (අ) | | | 2020 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **19,414** | **24,562** | **-5,148** | **13,083** | **18,271** | **-5,189** |
| **භාණ්ඩ** | **11,940** | **19,937** | **-7,997** | **10,047** | **16,055** | **-6,008** |
| වෙළඳ භාණ්ඩ | 11,940 | 19,935 | -7,995 | 10,047 | 16,047 | -5,999 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 3 | -3 | - | 9 | -9 |
| **සේවා** | **7,474** | **4,625** | **2,849** | **3,035** | **2,216** | **819** |
| ප්‍රවාහන | 2,339 | 1,710 | 630 | 1,174 | 1,059 | 114 |
| මුහුදු ප්‍රවාහන | 1,155 | 820 | 335 | 702 | 635 | 67 |
| නැව් කුලී | 1,155 | 820 | 335 | 702 | 635 | 67 |
| ගුවන් ප්‍රවාහන | 1,184 | 889 | 295 | 472 | 424 | 48 |
| මගී ගාස්තු | 1,056 | 798 | 258 | 394 | 354 | 40 |
| ගුවන් කුලී | 128 | 91 | 37 | 78 | 71 | 7 |
| සංචාරක (ඇ) | 3,607 | 1,638 | 1,969 | 682 | 449 | 234 |
| ඉදිකිරීම් | 67 | 35 | 32 | 7 | 10 | -3 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 137 | 102 | 36 | 39 | 82 | -42 |
| මූල්‍ය සේවා | 213 | 470 | -258 | 96 | 220 | -125 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 1,054 | 515 | 539 | 995 | 288 | 706 |
| විදුලි සන්දේශ | 155 | 135 | 21 | 24 | 32 | -8 |
| පරිගණක සේවා | 899 | 380 | 519 | 971 | 257 | 714 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 35 | 78 | -43 | 16 | 37 | -21 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 21 | 77 | -56 | 26 | 70 | -44 |
| **ප්‍රාථමික ආදායම්** | **252** | **2,713** | **-2,462** | **198** | **2,300** | **-2,101** |
| සේවක වැටුප් | 31 | 130 | -99 | 36 | 132 | -96 |
| ආයෝජන ආදායම් | 220 | 2,583 | -2,363 | 162 | 2,167 | -2,006 |
| සෘජු ආයෝජන | 26 | 855 | -828 | 17 | 619 | -602 |
| ලාභාංශ | 14 | 595 | -581 | 14 | 428 | -414 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 13 | 260 | -247 | 3 | 191 | -188 |
| විවිධ ආයෝජන | - | 1,044 | -1,044 | - | 932 | -932 |
| හිමිකම් | - | 67 | -67 | - | 18 | -18 |
| පොලී ආදායම් | - | 976 | -976 | - | 914 | -914 |
| කෙටි කාලීන | - | 8 | -8 | - | 2 | -2 |
| දිගු කාලීන | - | 969 | -969 | - | 911 | -911 |
| අනෙකුත් ආයෝජන | 97 | 685 | -588 | 56 | 617 | -560 |
| සංචිත වත්කම් | 97 | - | 97 | 89 | - | 89 |
| **ද්විතීයික ආදායම්** | **6,726** | **960** | **5,766** | **7,117** | **910** | **6,207** |
| රජය | 9 | - | 9 | 13 | - | 13 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,717 | 960 | 5,757 | 7,104 | 910 | 6,194 |
| **ජංගම ගිණුම** | **26,392** | **28,236** | **-1,843** | **20,398** | **21,481** | **-1,083** |
| **ප්‍රාග්ධන ගිණුම** | **51** | **28** | **23** | **51** | **23** | **28** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 51 | 28 | 23 | 51 | 23 | 28 |
| රජය | 16 | - | 16 | 24 | - | 24 |
| සංස්ථා සහ කුටුම්බ | 34 | 28 | 7 | 27 | 23 | 4 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **26,443** | **28,263** | **-1,820** | **20,449** | **21,504** | **-1,055** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**5.3 රූප සටහන**
**අපනයන, ආනයන සහ වෙළඳ හිඟය**
**(එ.ජ. ඩොලර් බිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2.1 වෙළඳ ගිණුම

### වෙළඳ ශේෂය

වෙළඳ ගිණුමේ හිඟය 2019 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 7,997 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,008ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. වෙළඳ ගිණුමෙහි මෙම සාධනීය වර්ධනය, අපනයන ආදායම කොවිඩ්-19 වසංගත තත්ත්වය ආශ්‍රිත පසුබෑමේ සිට අපේක්ෂිත කාලයට පෙර යථා තත්ත්වයට පත්වීම සහ අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල මෙන්ම ගෝලීය බනිජ තෙල් මිල ගණන් සාපේක්ෂ වශයෙන් පහළ අගයක පැවතීම හේතුවෙන් ආනයන වියදම පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් වේ. ඒ අනුව, 2010 වසරේ සිට ශ්‍රී ලංකාවේ පැවති අවම වෙළඳ හිඟය 2020 වසරේ දී වාර්තා විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2019 වසරේ වාර්තා වූ සියයට 9.5 සිට 2020 වසරේ දී සියයට 7.4 දක්වා අඩු විය.

### අපනයන හා ආනයන ක්‍රියාකාරිත්වය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### අපනයන ක්‍රියාකාරිත්වය

කොවිඩ්-19 වසංගතය මැඩලීම අරමුණු කර ගනිමින් සෞඛ්‍ය රීති දැඩි ලෙස ක්‍රියාත්මක වූ මාස කිහිපය තුළ වෙළඳ භාණ්ඩ අපනයනයට විශාල බලපෑමක් එල්ල වුවද, අපේක්ෂිත කාලයට පෙර වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පූර්ව වසංගත තත්ත්වයට ළඟා විය. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය වැළැක්වීම උදෙසා ශ්‍රී ලංකාව තුළ සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම් සහ අනෙකුත් ප්‍රජා සෞඛ්‍ය මාර්ගෝපදේශ, අපනයන භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි 2020 වසරේ දී අහිතකර ලෙස බලපෑවේය. මේ අතර, විදේශ ඉල්ලුම පහත වැටීම, භාණ්ඩ ප්‍රවාහන සහ සැපයුම් ජාලයන්ට බාධා සිදු වීම, වෙනත් රටවල වසංගත මර්දන ක්‍රියාමාර්ග හේතුවෙන් අවශ්‍ය යෙදවුම් ආනයනය සම්බන්ධයෙන් ඇති වූ ගැටළු සහ මිල ගණන් අහිතකර ලෙස වෙනස් වීම ද සමස්ත අපනයන ක්‍රියාකාරිත්වයට පසුගිය වසර තුළ විශාල බලපෑමක් එල්ල කළේය. ඒ අනුව, 2020 වසරේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 10,047ක් දක්වා පහළ ගිය අතර, එය 2019 වසරට සාපේක්ෂව සියයට 15.9ක පහත වැටීමකි. අපනයන ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසරේ සියයට 14.2ක් වූ අතර, එය 2020 වසරේ දී සියයට 12.4ක් දක්වා පහත වැටිණි. කොවිඩ්-19 සෞඛ්‍ය රීතීන් තදින්ම ක්‍රියාත්මක වූ 2020 වසරේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසයන් හි දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත විශාලතම අපනයන පහත වැටීම් වාර්තා වූ අතර, ජූනි, ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාසයන්හි දී ද සැලකිය යුතු මට්ටමේ පහත වැටීමක් දක්නට ලැබිණි. පුද්ගලික සනීපාරක්ෂක උපකරණ (PPE) අපනයනයේ සැලකිය යුතු වර්ධනයක් ද සමඟ ජූලි සහ සැප්තැම්බර් මාසවල අපනයන ආදායම් පසුගිය වසරේ අනුරූප මාසවලට සාපේක්ෂව ඉහළ ගියේය. 2019 වසරට සාපේක්ෂව කාර්මික භාණ්ඩ බොහොමයක අපනයන පහත වැටීමක් වාර්තා වූ අතර, ඇතැම් නිෂ්පාදිතයන්ගේ සැලකිය යුතු වර්ධනයක් සමඟ කෘෂිකාර්මික භාණ්ඩ අපනයනය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.

5

**5.4 රූප සටහන**
**අපනයන සංයුතිය - 2020**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**සමස්තයක් වශයෙන් කාර්මික භාණ්ඩ අපනයන ආදායම 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී, සියයට 18.6කින් පහළ වැටුණු අතර, භාණ්ඩ වර්ග බොහොමයක අපනයන ඉපැයීම් අඩු වීම එයට හේතු විය.** ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන භාණ්ඩය වන රෙදිපිළි සහ ඇඟලුම් අපනයනයෙන් ඉපැයූ ආදායම 2020 වසරේ දී සියයට 21.0ක පහළ යෑමක් පෙන්නුම් කළේය. නැව් සහ ගුවන් යානා සඳහා යොදා ගනු ලබන ඉන්ධනවල සැපයුම් ප්‍රමාණයන්ගේ මෙන්ම මිල ගණන්වල පහත වැටීම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය. ලොව පුරා නාවික හා ගුවන් කටයුතුවලට ඇති වූ බලපෑම් මේ සඳහා දායක විය. කෙසේ වුවද, ආහාර, පාන වර්ග සහ දුම්කොළ යන කාණ්ඩය ඉහළ ආදායමක් වාර්තා කළ අතර, අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ඉහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2020 වසරේ දී, රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත යන කාණ්ඩ යටතට ගැනෙන රෙදි මුහුණු ආවරණ, ශල්‍ය සහ අනෙකුත් අත් ආවරණ සහ ප්ලාස්ටික් ඇඳුම් උපාංග ආදී වූ පුද්ගලික සනීපාරක්ෂක උපකරණ අපනයනය ඉහළ ගියේය. පුද්ගලික සනීපාරක්ෂක උපකරණ ආශ්‍රිත අයිතම අපනයනයෙන් ලැබුණු ආදායම 2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 693 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 942ක් දක්වා ඉහළ ගියේය.

**2019 වසරට සාපේක්ෂව, 2020 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායම සියයට 5.1ක අඩුවීමක් වාර්තා කළ අතර, කුළුබඩු, පොල්, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, රබර් සහ එළවළු ආදායම ඉහළ ගිය නමුත් තේ, මුහුදු ආහාර සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම අඩුවීම මේ සඳහා හේතු විය.** කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තියේ පළමු රැල්ල තුළ දී, තේ අපනයන පරිමාවන් සහ ඒකක අගයයන් සැලකිය යුතු ලෙස පහත වැටුණ ද, වසරේ අග මාස කිහිපයේ දී යම්තාක් දුරකට යථා තත්ත්වයට පත් විය. ප්‍රධාන

**5.3 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2019 | | 2020 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,461.9** | **20.6** | **2,336.2** | **23.3** | **-125.6** | **-5.1** | **6.6** |
| තේ | 1,346.4 | 11.3 | 1,240.9 | 12.4 | -105.5 | -7.8 | 5.6 |
| පොල් | 329.5 | 2.8 | 345.2 | 3.4 | 15.7 | 4.8 | -0.8 |
| කුළුබඩු | 312.5 | 2.6 | 333.5 | 3.3 | 20.9 | 6.7 | -1.1 |
| මුහුදු ආහාර | 262.5 | 2.2 | 189.8 | 1.9 | -72.6 | -27.7 | 3.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 120.0 | 1.0 | 134.7 | 1.3 | 14.6 | 12.2 | -0.8 |
| එළවළු | 32.0 | 0.3 | 36.6 | 0.4 | 4.6 | 14.3 | -0.2 |
| රබර් | 24.2 | 0.2 | 30.1 | 0.3 | 5.9 | 24.4 | -0.3 |
| සකස් නොකළ දුම්කොළ | 34.7 | 0.3 | 25.5 | 0.3 | -9.2 | -26.6 | 0.5 |
| **කාර්මික අපනයන** | **9,426.3** | **78.9** | **7,672.0** | **76.4** | **-1,754.3** | **-18.6** | **92.7** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,596.5 | 46.9 | 4,423.1 | 44.0 | -1,173.4 | -21.0 | 62.0 |
| රබර් නිෂ්පාදිත | 866.1 | 7.3 | 786.1 | 7.8 | -80.0 | -9.2 | 4.2 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 447.0 | 3.7 | 464.0 | 4.6 | 17.0 | 3.8 | -0.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 521.1 | 4.4 | 373.6 | 3.7 | -147.6 | -28.3 | 7.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 400.0 | 3.3 | 337.5 | 3.4 | -62.5 | -15.6 | 3.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 305.7 | 2.6 | 181.5 | 1.8 | -124.3 | -40.6 | 6.6 |
| ප්‍රවාහන උපකරණ | 145.9 | 1.2 | 71.4 | 0.7 | -74.5 | -51.0 | 3.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 102.9 | 0.9 | 53.9 | 0.5 | -48.9 | -47.6 | 2.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 48.3 | 0.4 | 47.9 | 0.5 | -0.4 | -0.8 | 0.02 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 30.1 | 0.3 | 24.0 | 0.2 | -6.1 | -20.2 | 0.3 |
| අනෙකුත් කාර්මික අපනයන | 962.8 | 8.1 | 909.0 | 9.0 | -53.8 | -5.6 | 2.8 |
| **ඛනිජ අපනයන** | **33.9** | **0.3** | **25.1** | **0.2** | **-8.8** | **-25.9** | **0.5** |
| **වර්ග නොකළ අපනයන** | **17.9** | **0.2** | **14.1** | **0.1** | **-3.8** | **-21.4** | **0.2** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **11,940.0** | **100.0** | **10,047.4** | **100.0** | **-1,892.6** | **-15.9** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **178.78** | | **185.52** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් අපනයනය කරන ලද පරිමාව ඉහළ යෑම හේතුවෙන් කුරුඳු, ගම්මිරිස්, වියළි එළවළු, පුවක්, පොල් තෙල් හා කෙඳි සහ ස්වාභාවික රබර් ආදිය ඇතුළත් කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් වූ ඉපැයීම් වසර තුළ දී ඉහළ ගියේය.

**ඛනිජ අපනයන ආදායම 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 25.9කින් පහළ ගියේය.** ඛනිජ අපනයනයෙන් ඉපැයූ ආදායම 2020 වසරේ සමස්ත අපනයන ආදායමෙන් සියයට 0.2ක් පමණක් වූ සුළු මට්ටමක පැවතිණ. ඛනිජ ආනයනය කරනු ලබන රටවල් එම සම්පත් ඉහළ වටිනාකමකින් යුතු නිෂ්පාදන සඳහා උපයෝගී කරගනු ලබයි. මෙම තත්ත්වය හඳුනා ගනිමින්, එකතු කළ අගය අඩු මට්ටමකින් අපනයනය කිරීම අධෛර්යමත් කර, දේශීය ඛනිජ ද්‍රව්‍ය යොදා ගනිමින් රට තුළ භාණ්ඩ නිෂ්පාදනය දිරි ගැන්වීමට රජය අරමුණු කරයි.

### ආනයන ක්‍රියාකාරිත්වය

**2019 වසරට සාපේක්ෂව 2020 වසරේ අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ වැටීමත් සමඟ, සමස්ත ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,055ක් දක්වා සියයට 19.5කින් පහත වැටුණි.** අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් රජය විසින් සීමා පැනවීම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් පහත වැටීම, රටේ ආර්ථික කටයුතු පසුබෑමකට ලක් වීම නිසා අන්තර් භාණ්ඩ ආනයනය පහත වැටීම සහ ගෝලීය සැපයුම් දාමයන්ට බාධා සිදු වීම යනාදී කරුණු සමස්තයක් ලෙස ආනයන වියදම පහළ යෑමට හේතු විය.

**5.5 රූප සටහන**
**ආනයන සංයුතිය - 2020**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 9,076ක් දක්වා සියයට 20.2කින් පහත වැටුණි.** අන්තර් භාණ්ඩ ආනයන අතර ඉහළම දායකත්වය සපයන බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම, ප්‍රධාන වශයෙන් මිල ගණන් පහත වැටීම හේතුවෙන්, 2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,677 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,325ක් දක්වා පහත වැටුණි. 2020 වසර තුළ දී බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාවන් ද පිළිවෙළින් සියයට 9.3කින් සහ සියයට 15.0කින් පහත වැටුණි. මේ අතර, 2019 වසරේ එ.ජ. ඩොලර් 89.79ක් වූ ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක ආනයන මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දී එ.ජ. ඩොලර් 83.60ක් දක්වා පහළ යෑමත් සමඟ ගල් අඟුරු ආනයන පරිමාව සියයට 8.8කින් ඉහළ ගිය අතර, එමගින් ගල් අඟුරු ආනයන වියදම සියයට 1.3කින් ඉහළ ගියේය. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සියයට 19.7කින් පහත වැටුණු අතර, ගෝලීය කොවිඩ්-19 ව්‍යාප්තිය උග්‍රව පැවති කාල වකවානුව තුළ ඇඟලුම් නිෂ්පාදන පරිමාව පහත වැටීම සහ රෙදිපිළි යෙදවුම් ආනයනය සඳහා පැවති දුෂ්කරතා එයට හේතු විය. 2020 වසරේ දී, අනෙකුත් ආනයනික අන්තර් භාණ්ඩ වර්ග බොහොමයක අඩු වීමක් දක්නට ලැබුණ ද තිරිඟු, පොහොර සහ කෘෂිකාර්මික යෙදවුම් ආදී වූ භාණ්ඩ ආනයන වියදමෙහි වැඩි වීමක් දක්නට ලැබිණි.

5

**2020 වසරේ ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 3,563ක් දක්වා සියයට 22.6කින් පහත වැටුණි.** 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ ත්‍රිත්වයේම ආනයන වියදම සමස්තයක් ලෙස පහළ ගියේය. මේ සඳහා හේතු වූයේ ආනයන සීමා කිරීම් සහ වසංගත තත්ත්වය හේතුවෙන් ගෝලීය සහ දේශීය ආර්ථිකයට සිදු වූ විවිධ බලපෑමය. මෙම වසර තුළ ඉහත දැක්වූ ආයෝජන භාණ්ඩ කාණ්ඩ ත්‍රිත්වයම යටතට ගැනෙන බොහෝ අයිතමවල ආනයන වියදමේ පහත වැටීමක් දක්නට ලැබුණු නමුත්, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, ටර්බයින, කෘෂිකාර්මික ට්‍රැක්ටර්, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සහ පරිගණක ආනයනයේ ඉහළ යෑමක් දක්නට ලැබිණි.

### 5.4 සංඛ්‍යා සටහන
### ආනයන සංයුතිය

| කාණ්ඩය | 2019 | | 2020 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,956.5** | **19.8** | **3,401.7** | **21.2** | **-554.9** | **-14.0** | **14.3** |
| ආහාර හා පාන වර්ග | 1,426.9 | 7.2 | 1,554.4 | 9.7 | 127.5 | 8.9 | -3.3 |
| සහල් | 12.8 | 0.1 | 10.5 | 0.1 | -2.3 | -17.7 | 0.1 |
| සීනි හා රසකැවිලි | 201.2 | 1.0 | 277.1 | 1.7 | 75.9 | 37.7 | -2.0 |
| කිරි නිෂ්පාදිත | 311.9 | 1.6 | 333.8 | 2.1 | 21.9 | 7.0 | -0.6 |
| පරිප්පු | 79.9 | 0.4 | 96.9 | 0.6 | 17.0 | 21.3 | -0.4 |
| වෙනත් | 821.2 | 4.1 | 836.0 | 5.2 | 14.9 | 1.8 | -0.4 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 2,529.6 | 12.7 | 1,847.3 | 11.5 | -682.3 | -27.0 | 17.6 |
| පෞද්ගලික රථවාහන | 815.7 | 4.1 | 282.9 | 1.8 | -532.8 | -65.3 | 13.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 552.6 | 2.8 | 595.5 | 3.7 | 42.9 | 7.8 | -1.1 |
| ගෘහ උපකරණ | 206.6 | 1.0 | 174.2 | 1.1 | -32.4 | -15.7 | 0.8 |
| රෙදිපිළි හා උපාංග | 275.1 | 1.4 | 200.7 | 1.2 | -74.5 | -27.1 | 1.9 |
| වෙනත් | 679.6 | 3.4 | 594.0 | 3.7 | -85.5 | -12.6 | 2.2 |
| **අන්තර් භාණ්ඩ** | **11,369.6** | **57.0** | **9,076.5** | **56.5** | **-2,293.1** | **-20.2** | **59.1** |
| ඉන්ධන | 3,891.6 | 19.5 | 2,542.6 | 15.8 | -1,349.0 | -34.7 | 34.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,909.4 | 14.6 | 2,335.1 | 14.5 | -574.3 | -19.7 | 14.8 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 201.4 | 1.0 | 117.2 | 0.7 | -84.2 | -41.8 | 2.2 |
| රසායනික නිෂ්පාදිත | 831.5 | 4.2 | 831.5 | 5.2 | 0.03 | 0.004 | -0.001 |
| තිරිඟු හා ඉරිඟු | 346.4 | 1.7 | 384.4 | 2.4 | 38.0 | 11.0 | -1.0 |
| පොහොර | 221.4 | 1.1 | 258.9 | 1.6 | 37.5 | 16.9 | -1.0 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,967.9 | 14.9 | 2,606.8 | 16.2 | -361.1 | -12.2 | 9.3 |
| **ආයෝජන භාණ්ඩ** | **4,602.6** | **23.1** | **3,563.2** | **22.2** | **-1,039.4** | **-22.6** | **26.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,489.7 | 12.5 | 2,176.1 | 13.6 | -313.6 | -12.6 | 8.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,508.7 | 7.6 | 1,035.6 | 6.5 | -473.1 | -31.4 | 12.2 |
| ප්‍රවාහන උපකරණ | 596.6 | 3.0 | 348.3 | 2.2 | -248.3 | -41.6 | 6.4 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 7.6 | 0.04 | 3.2 | 0.02 | -4.4 | -57.8 | 0.1 |
| **වර්ග නොකළ ආනයන** | **8.3** | **0.04** | **14.0** | **0.1** | **5.7** | **68.8** | **-0.1** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **19,937.1** | **100.0** | **16,055.4** | **100.0** | **-3,881.7** | **-19.5** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **178.78** | | **185.52** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රතිආනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව



බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත සහ විදුලි සන්දේශ මෙවලම් හැරුණු විට, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ වර්ග ආනයන වියදම සමස්තයක් වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය. මේ අනුව, පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය සියයට 27.0කින් පහළ ගිය අතර, මේ සඳහා ඉහළම දායකත්වය දැක්වූයේ පෞද්ගලික භාවිතය උදෙසා වන රථවාහන ආනයනය අඩු වීමයි. 2020 වසර තුළ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කරමින් රජය විසින් පැනවූ සීමා මෙන්ම, මීට ඉහත දී සඳහන් කළ සාධක ද ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීමට හේතු විය.

ශ්‍රී ලංකාවේ ආහාර හා පාන වර්ග ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,554ක් දක්වා සියයට 8.9කින් ඉහළ ගියේය. ආනයන වියදමෙහි විශාලතම ඉහළ යෑම් වාර්තා කළ කාණ්ඩ ත්‍රිත්වය වූයේ තෙල් සහ මේද වර්ග (පොල්තෙල් ආනයනය ඉහළ යෑම හේතුවෙන්), සීනි (ප්‍රධාන වශයෙන් වසරේ දෙවන භාගයේ දී) සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්) යන ආනයනයි. පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ වර්ග කළ ද, පොල්තෙල්, අන්තර් භාණ්ඩයක් ලෙස ද භාවිත කරයි. මේ අතර, 2020 වසර තුළ දී එළවළු ආනයන වියදම ඉහළ ගිය අතර, මෙයට මූලිකව හේතු වූයේ පරිප්පු, සුදු ළූණු හා අනෙකුත් ළූණු වර්ග, කඩල සහ අර්තාපල් ආනයනය ඉහළ යෑමය. තවද, මිරිස්, කොත්තමල්ලි ඇට, සුදුරු, මහදුරු සහ වැනිලා ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, කුළුබඩු ආනයන වියදම ද ඉහළ ගියේය. එහෙත් කහ සහ ගම්මිරිස් ආනයන වියදම පහළ ගියේය. මුහුදු ආහාර සහ පාන වර්ග ආනයන වියදම ද සැලකිය යුතු ලෙස පහළ ගියේය.

### 5.5 සංඛ්‍යා සටහන
### ප්‍රධාන ආනයනවල පරිමාවන්

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2016 | 2017 | 2018 | 2019 | 2020 (අ) |
|---|---|---|---|---|---|
| **පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)** | **3,885** | **4,895** | **4,959** | **4,740** | **4,028** |
| පළමු කාර්තුව | 830 | 1,275 | 1,382 | 1,199 | 1,249 |
| දෙවන කාර්තුව | 1,163 | 1,123 | 1,207 | 1,206 | 678 |
| තෙවන කාර්තුව | 749 | 1,336 | 1,317 | 1,211 | 1,123 |
| සිව්වන කාර්තුව | 1,142 | 1,161 | 1,054 | 1,124 | 978 |
| **බොරතෙල් (ආ)** | **1,685** | **1,591** | **1,674** | **1,842** | **1,667** |
| පළමු කාර්තුව | 372 | 282 | 283 | 461 | 464 |
| දෙවන කාර්තුව | 456 | 376 | 459 | 460 | 265 |
| තෙවන කාර්තුව | 384 | 464 | 461 | 461 | 568 |
| සිව්වන කාර්තුව | 473 | 469 | 471 | 460 | 370 |
| **තිරිඟු** | **948** | **1,250** | **1,297** | **1,159** | **1,404** |
| පළමු කාර්තුව | 171 | 291 | 412 | 164 | 272 |
| දෙවන කාර්තුව | 326 | 334 | 329 | 318 | 285 |
| තෙවන කාර්තුව | 271 | 359 | 285 | 292 | 498 |
| සිව්වන කාර්තුව | 179 | 265 | 271 | 385 | 348 |
| **පොහොර** | **527** | **399** | **861** | **707** | **952** |
| පළමු කාර්තුව | 139 | 78 | 256 | 148 | 88 |
| දෙවන කාර්තුව | 135 | 73 | 154 | 142 | 294 |
| තෙවන කාර්තුව | 126 | 129 | 225 | 238 | 126 |
| සිව්වන කාර්තුව | 127 | 119 | 226 | 179 | 444 |
| **සීනි** | **651** | **498** | **645** | **556** | **683** |
| පළමු කාර්තුව | 147 | 108 | 205 | 140 | 193 |
| දෙවන කාර්තුව | 144 | 158 | 166 | 153 | 108 |
| තෙවන කාර්තුව | 179 | 101 | 119 | 100 | 209 |
| සිව්වන කාර්තුව | 181 | 132 | 154 | 164 | 172 |
| **සහල්** | **30** | **748** | **249** | **24** | **16** |
| පළමු කාර්තුව | 6 | 259 | 203 | 8 | 8 |
| දෙවන කාර්තුව | 9 | 79 | 37 | 3 | 2 |
| තෙවන කාර්තුව | 6 | 160 | 2 | 5 | 2 |
| සිව්වන කාර්තුව | 8 | 250 | 7 | 8 | 4 |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ මිල අනුපාතය

**ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපනය කරන වෙළඳ මිල අනුපාතය 2020 වසරේ දී ඉහළ ගියේය.** 2019 වසරේ දී දර්ශකාංක 103.9ක් ලෙස වාර්තා වූ වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ දී දර්ශකාංක 106.5 දක්වා සියයට 2.5කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ආනයන මිල දර්ශකය දර්ශකාංක 8.2කින්, එනම් සියයට 9.1කින් පහළ යෑම (ප්‍රධාන වශයෙන් බොරතෙල් හා පිරිපහදු කරන ලද ඛනිජ තෙල් මිල ගණන් පහත වැටීම ඇතුළු හේතු නිසා) සහ අපනයන මිල දර්ශකය දර්ශකාංක 6.4කින් එනම්, සියයට 6.8කින් පහළ යෑම හේතු විය.

**කෘෂිකාර්මික අපනයන මිල දර්ශකය ඉහළ ගිය ද කාර්මික අපනයන මිල දර්ශකය පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී සමස්ත අපනයන මිල දර්ශකය පහත වැටුණි.** කාර්මික අපනයන මිල දර්ශකය දර්ශකාංක 8.6කින් එනම්, සියයට 9.4කින් පහළ ගිය අතර, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන (නැව් සහ ගුවන් යානා ඉන්ධන හා අනෙක් ඛනිජ තෙල් නිෂ්පාදිත) ආශ්‍රිත මිල දර්ශකය පහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, වසර තුළ දී මිල දර්ශක පහළ ගිය අනෙක් අපනයන අතර මූල ලෝහ හා උපාංග, ප්‍රවාහන උපකරණ, දව හා කඩදාසි නිෂ්පාදිත, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, පිඟන් මැටි නිෂ්පාදිත, සහ සත්ත්ව ආහාර ආශ්‍රිත මිල දර්ශක විය. රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ආහාර පාන වර්ග හා දුම්කොළ වැනි ප්‍රධාන අපනයන කිහිපයක මිල දර්ශකවල සුළු ඉහළ යෑමක් වාර්තා විය. 2020 වසරේ දී කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන සඳහා වන මිල දර්ශකය දර්ශකාංක 2.7කින් එනම්, සියයට 2.5කින් ඉහළ ගිය අතර තේ, පොල්, කුළුබඩු, මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සඳහා වන මිල දර්ශක ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, සකස් නොකළ දුම්කොළ සහ එළවළු සඳහා වන මිල දර්ශක වසර තුළ දී පහළ ගියේය. මේ අතර, 2020 වසරේ දී ඛනිජ අපනයන ආශ්‍රිත මිල දර්ශකය දර්ශකාංක 8.7කින්, එනම්, සියයට 6.1කින් ඉහළ ගියේය.

5

### 5.6 රූප සටහන
### වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.6 සංඛ්‍යා සටහන
## වෙළඳ දර්ශක (අ)

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2019 | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2019 | 2020 (ආ) | වාර්ෂික වෙනස්වීම% |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **106.8** | **101.3** | **-5.1** | **97.7** | **90.5** | **-7.4** | **109.3** | **112.0** | **2.5** |
| තේ | 93.5 | 86.2 | -7.8 | 88.8 | 80.7 | -9.2 | 105.3 | 106.8 | 1.5 |
| රබර් | 14.0 | 17.4 | 24.4 | 24.0 | 29.4 | 22.7 | 58.3 | 59.1 | 1.4 |
| පොල් | 198.9 | 208.4 | 4.8 | 177.6 | 168.0 | -5.4 | 112.0 | 124.0 | 10.7 |
| කුළුබඩු | 150.9 | 161.0 | 6.7 | 115.0 | 114.5 | -0.4 | 131.2 | 140.6 | 7.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 168.1 | 188.6 | 12.2 | 163.0 | 173.1 | 6.2 | 103.1 | 108.9 | 5.6 |
| **කාර්මික අපනයන** | 154.7 | 125.9 | -18.6 | 170.8 | 153.5 | -10.1 | 90.6 | 82.1 | -9.4 |
| රෙදිපිළි හා ඇඟලුම් | 166.9 | 131.9 | -21.0 | 143.2 | 111.5 | -22.1 | 116.6 | 118.3 | 1.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 198.0 | 141.9 | -28.3 | 246.7 | 238.5 | -3.3 | 80.3 | 59.5 | -25.9 |
| රබර් නිෂ්පාදිත | 155.6 | 141.2 | -9.2 | 109.4 | 100.0 | -8.7 | 142.2 | 141.3 | -0.6 |
| **ඛනිජ අපනයන** | **139.9** | **103.6** | **-25.9** | **98.2** | **68.6** | **-30.2** | **142.4** | **151.2** | **6.1** |
| **මුළු අපනයන** | **138.5** | **116.5** | **-15.9** | **147.2** | **132.9** | **-9.7** | **94.1** | **87.7** | **-6.8** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **159.9** | **137.5** | **-14.0** | **145.4** | **128.0** | **-12.0** | **110.0** | **107.4** | **-2.3** |
| ආහාර හා පාන වර්ග | 107.9 | 117.5 | 8.9 | 120.5 | 127.4 | 5.7 | 89.5 | 92.2 | 3.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 219.7 | 160.4 | -27.0 | 174.0 | 128.7 | -26.0 | 126.3 | 124.7 | -1.3 |
| **අන්තර් භාණ්ඩ** | **141.3** | **112.8** | **-20.2** | **156.0** | **140.2** | **-10.2** | **90.5** | **80.5** | **-11.1** |
| ඉන්ධන | 128.0 | 83.6 | -34.7 | 151.8 | 133.1 | -12.3 | 84.3 | 62.8 | -25.5 |
| පොහොර | 92.2 | 107.8 | 16.9 | 119.5 | 160.2 | 34.1 | 77.1 | 67.3 | -12.8 |
| රසායනික නිෂ්පාදිත | 159.9 | 159.9 | 0.004 | 155.7 | 157.9 | 1.4 | 102.7 | 101.3 | -1.4 |
| තිරිඟු සහ ඉරිඟු | 130.5 | 144.8 | 11.0 | 127.5 | 138.9 | 8.9 | 102.3 | 104.3 | 1.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 160.8 | 129.1 | -19.7 | 153.9 | 126.8 | -17.6 | 104.5 | 101.8 | -2.6 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 144.9 | 127.7 | -11.9 | 158.5 | 148.9 | -6.1 | 91.4 | 85.8 | -6.2 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 53.3 | 31.0 | -41.8 | 66.5 | 36.5 | -45.1 | 80.2 | 85.1 | 6.0 |
| **ආයෝජන භාණ්ඩ** | **167.1** | **129.3** | **-22.6** | **211.5** | **183.4** | **-13.3** | **79.0** | **70.5** | **-10.7** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 183.6 | 126.0 | -31.4 | 215.1 | 147.7 | -31.4 | 85.3 | 85.4 | 0.01 |
| ප්‍රවාහන උපකරණ | 100.7 | 58.8 | -41.6 | 93.7 | 50.4 | -46.2 | 107.5 | 116.6 | 8.5 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 186.1 | 162.7 | -12.6 | 261.5 | 264.5 | 1.1 | 71.2 | 61.5 | -13.6 |
| **මුළු ආනයන** | **148.7** | **119.7** | **-19.5** | **164.2** | **145.5** | **-11.4** | **90.5** | **82.3** | **-9.1** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **103.9** | **106.5** | **2.5** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

2020 වසරේ දී අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයන ආශ්‍රිත මිල ගණන් පහත වැටීමත් සමඟ සමස්ත ආනයන මිල දර්ශකය පහළ ගියේය. අන්තර් භාණ්ඩ සඳහා වන මිල දර්ශකය දර්ශකාංක 10.1කින්, එනම් සියයට 11.1කින් පහළ ගිය අතර, ඉන්ධන, පොහොර, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ඇතුළු බොහෝ උප කාණ්ඩවල මිල ගණන් පහළ යෑම එයට හේතු විය. කෙසේ වුවද, තිරිඟු සහ ඉරිඟු, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග සහ ආහාර සැකසුම් ආශ්‍රිත ආනයන මිල දර්ශක වසර තුළ දී ඉහළ ගියේය. ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන මිල දර්ශකය දර්ශකාංක 8.5කින්, එනම් සියයට 10.7කින් පහළ ගිය අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිල ගණන් පහළ යෑම එයට හේතු විය. කෙසේ වෙතත්, ප්‍රවාහන උපකරණ මිල දර්ශකය ඉහළ ගියේය. පාරිභෝගික භාණ්ඩ ආනයන මිල දර්ශකය දර්ශකාංක 2.6කින්, එනම් සියයට 2.3කින් පහළ ගිය අතර, ආහාර හා පාන වර්ග ආශ්‍රිත මිල දර්ශකයේ ඉහළ යෑම අභිබවා ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ මිල දර්ශකය පහළ යෑම එයට හේතු විය. ගෘහ හා දුව භාණ්ඩ සහ විදුලි සන්දේශ මෙවලම් හැර ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ ඇති බොහෝ උප කාණ්ඩවල මිල ගණන් පහළ ගියේය. මේ අතර, ආහාර හා පාන වර්ග මිල දර්ශකය දර්ශකාංක 2.7කින්, එනම් සියයට 3.0කින්, ඉහළ ගිය අතර, කුළුබඩු, සීනි හා රසකැවිලි, එළවළු, තෙල් හා මේද වර්ග සහ මුහුදු ආහාර ඇතුළු බොහෝ උප කාණ්ඩ ආශ්‍රිත මිල දර්ශක ඉහළ යෑම එයට හේතු විය. කෙසේ වුවද, පාන වර්ග සඳහා වන මිල දර්ශකය වසර තුළ දී පහළ ගියේය.

අපනයන ආදායම සහ ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වීම සඳහා වෙළඳ පරිමාවන් අඩු වීම හේතු විය. කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ ද්‍රව්‍ය අපනයන යන ප්‍රධාන අපනයන කාණ්ඩ ත්‍රිත්වය සඳහා වන අපනයන පරිමා දර්ශක පහළ ගිය අතර, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන ආනයන කාණ්ඩ ත්‍රිත්වය සඳහා වන ආනයන පරිමා දර්ශක ද පහළ ගියේය.

## වෙළඳ දිශාව

**2020 වසරේ දී අපනයන සහ ආනයන විශාල වශයෙන් පහළ වැටීමත්, ලොව පුරා සැපයුම් දාමයන්ට බාධා එල්ලවීමත් හමුවේ වුව ද, පෙර වසර හා සැසඳීමේ දී සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ වෙනසක් සිදු නොවුණි.** වටිනාකම අනුව සැලකූවිට, ඉන්දියාව පසුකරමින් ඉදිරියට පැමිණි චීනය, 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා බවට පත් විය. ඉන් අනතුරුව, ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රධාන හවුල්කරු වූ අතර, එම රටවල් තුන ශ්‍රී ලංකාවේ ආනයන සහ අපනයන ද්විත්වයම ඇතුළත් සමස්ත විදේශ වෙළඳාමෙන් සියයට 40කට පමණ දායක විය. 2019 වසරේ චීනය, ඉන්දියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 12.6ක් ලෙස සටහන් වුවද, 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතයෙන් සිදු වූ බලපෑම් හේතුවෙන් එම ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 10.5ක් දක්වා පහත වැටුණි. අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ සිදු කළ සමස්ත වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ද 2020 වසර තුළ දී, පහළ වැටුණු අතර ඕමානය, කුවේටය සහ දකුණු අප්‍රිකාව වැනි ඇතැම් කුඩා වෙළඳ හවුල්කරුවන් සමඟ සිදු වූ සමස්ත වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ඉහළ ගියේය. 2020 වසරේ රටවල් අනුව වෙළඳ ශේෂ සලකා බැලීමේ දී, ඇමෙරිකා එක්සත් ජනපදය (එ.ජ. ඩොලර් බිලියන 2ක්), එක්සත් රාජධානිය (එ.ජ. ඩොලර් මිලියන 698ක්), ජර්මනිය (එ.ජ. ඩොලර් මිලියන 254ක්) මෙන්ම බෙල්ජියම, නෙදර්ලන්තය සහ ඉතාලිය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනුවල දී ශ්‍රී ලංකාව සැලකිය යුතු වෙළඳ අතිරික්ත වාර්තා කළේය. ආසියානු රටවල් වන චීනය (එ.ජ. ඩොලර් බිලියන 3.4ක්), ඉන්දියාව (එ.ජ. ඩොලර් බිලියන 2.5ක්), එක්සත් අරාබි එමීර් රාජ්‍ය (එ.ජ. ඩොලර් මිලියන 845ක්) මෙන්ම සිංගප්පූරුව, මැලේසියාව සහ ජපානය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනුවල දී ශ්‍රී ලංකාව සැලකිය යුතු වෙළඳ හිඟයන් වාර්තා කළේය. ආසියානු කලාපයේ රටවල් සමඟ වෙළඳ ශේෂයන් වර්ධනය

**5.7 රූප සටහන**
**රටවල් අනුව වෙළඳ ශේෂයන් (එ.ජ. ඩොලර් මිලියන)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කර ගැනීම සඳහා එම රටවලින් ලැබෙන අපනයන ආදායම ඉහළ නංවා ගැනීමට සහ ආනයන වියදම අඩු කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය මෙමගින් පෙන්වා දෙයි.

**2020 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා රටවල් තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත විය.** ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විශාලතම තනි ගැනුම්කරුවා වූ අතර, සමස්ත අපනයන අතරින් සියයට 24.9ක්, එනම් එ.ජ. ඩොලර් බිලියන 2.5ක් වටිනා අපනයන මිල දී ගෙන ඇත. මෙයට අමතරව, එක්සත් රාජධානිය (සියයට 9.0ක්), ඉන්දියාව (සියයට 6.0ක්), ජර්මනිය (සියයට 5.7ක්) සහ ඉතාලිය (සියයට 4.5ක්) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත විය. 2020 වසරේ දී සමස්ත අපනයන ආදායම පහළ යෑමට සමගාමීව බොහෝ අපනයන ගමනාන්ත, ප්‍රධානම අපනයන ගමනාන්ත දහය ද ඇතුළුව, පහළ මට්ටමක අපනයන වාර්තා කළේය. කෙසේ වුවද, මෙම වසර තුළ, ඇතැම් කුඩා අපනයන ගමනාන්ත වෙත වූ අපනයනවලින් ඉපැයූ ආදායම සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයන ප්‍රධාන වශයෙන් ඇඟලුම්, රබර් නිෂ්පාදිත, රෙදිපිළි උපාංග (මුහුණු ආවරණ ආදිය), ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ කුළුබඩු යනාදියෙන් සමන්විත විය. 2019 වර්ෂයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 700ක පමණ පහළ යෑමක් වාර්තා කළ ද, ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම තනි ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස 2020 වසරේ සමස්ත

5

ඇඟලුම් අපනයන වටිනාකමෙන් සියයට 42කට දායක විය. 2020 වසරේ එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයන අතර, ඇඟලුම් (සමස්ත ඇඟලුම් අපනයනයෙන් සියයට 14ක් පමණ), ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්ලාස්ටික් ඇඳුම් උපාංග ආදිය), රෙදිපිළි උපාංග, රබර් නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අයත් වේ. සත්ත්ව ආහාර, කුළුබඩු, රෙදිපිළි, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, ඉන්දියාවට සිදු කළ අපනයන අතරට ඇතුළත් විය. මේ අතර, ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ සහ මුහුදු ආහාර ජර්මනියට සහ ඉතාලියට අපනයනය කළ භාණ්ඩ අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලැබීය. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා කලාපයක් ලෙස ප්‍රධානතම වෙළඳපොළ වන යුරෝපා සංගමයට අයත් රටවල් වෙත (එක්සත් රාජධානිය ඇතුළුව) සිදු කළ අපනයන 2020 වසරේ සමස්ත අපනයනයෙන් සියයට 32ක් පමණ වූ අතර, ප්‍රධාන වශයෙන් ඇඟලුම්වලින් (සමස්ත ඇඟලුම් අපනයනවලින් සියයට 44ක් පමණ) සමන්විත විය. රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ මුහුදු ආහාර යුරෝපා වෙළඳපොළ වෙත අපනයනය කළ අනෙකුත් ප්‍රධාන අයිතම වූ අතර, ඒවායෙන් බොහොමයක් යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) යටතේ සිදු කළ අපනයන විය. 2020 වසරේ දී මැද පෙරදිග රටවල් සහ රුසියාව ඇතුළුව ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් තේ සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත වූ අතර, රටේ සමස්ත තේ අපනයනවලින් සියයට 60කට පමණ එම ගමනාන්ත දායක විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයේ රටවල් එක්ව සැලකූ විට ඉපැයූ අපනයන ආදායම 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමෙන් සියයට 57ක් පමණ වූ අතර, මෙමගින් ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ වෙළඳපොළ විවිධාංගීකරණය පිළිබඳ අඩුලුහුඩුකම් පිළිබිඹු කෙරෙයි.

**2020 වසරේ දී ද ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රධාන රටවල් වූයේ ආසියානු කලාපයේ රටවල් ය.** 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.5කට වැඩි ආනයන වියදමක් හා සමස්ත ආනයන සඳහා සියයට 22ක පමණ දායකත්වයක් දක්වමින් චීනය අඛණ්ඩව දෙවැනි වතාවටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය ලෙස පැවතුණි. ඉන්



**5.8 රූප සටහන**
**අපනයන වෙළඳ දිශාව**




මූලය: ශ්‍රී ලංකා රේගුව

**5.9 රූප සටහන**
**ආනයන වෙළඳ දිශාව**




මූලය: ශ්‍රී ලංකා රේගුව

අනතුරුව, ඉන්දියාව (සියයට 19.2ක්), එක්සත් අරාබි එමීර් රාජ්‍ය (සියයට 6.4ක්), සිංගප්පූරුව (සියයට 4.3ක්) සහ මැලේසියාව (සියයට 3.8ක්) ප්‍රධාන ආනයන ප්‍රභව විය. 2020 වසරේ දී සමස්ත ආනයන වියදම පහත වැටීමත් සමග ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය සිදු කරන ප්‍රධාන රටවල් දහය ඇතුළු බොහෝ රටවලට අදාළව ආනයන වියදම පහත වැටුණි. චීනය වෙතින් ආනයනය කරනු ලැබූ රෙදිපිළි හා රෙදිපිළි උපාංග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදිත වැනි බොහෝ ප්‍රධාන ආනයන අයිතමවල වියදම 2020 වසරේ දී පහත වැටුණ ද, විදුලි සන්දේශ මෙවලම් (ජංගම දුරකථන වැනි) ආනයන වියදම ඉහළ ගියේය. එසේම, ඉන්දියාව වෙතින් සිදු කළ රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය, සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන පහත වැටුණ ද, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, සහ සීනි හා රසකැවිලි ආනයන වියදම ඉහළ ගියේය. 2020 වසරේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍ය, සිංගප්පූරුව සහ මැලේසියාව වෙතින් ආනයනය කළ ප්‍රධාන අයිතමය වූයේ ඛනිජ තෙල් නිෂ්පාදිතයන් ය. එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙතින් ආනයනය කළ අනෙකුත් ප්‍රධාන අයිතම වූයේ මූල ලෝහ, මුහුදු ආහාර සහ ඛනිජ නිෂ්පාදිතයන් ය. ඒ අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සිංගප්පූරුව වෙතින් වූ අනෙකුත් ප්‍රධාන ආනයන අයිතම විය. ආහාර සැකසුම් (පාම් තෙල් වැනි), රසායනික නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ තෙල් හා මේද (පොල්තෙල් වැනි) මැලේසියාව වෙතින් ආනයනය කළ වෙනත් ප්‍රධාන අයිතම විය. 2019 වසරේ දී පස්වැනි ප්‍රධාන ආනයන ප්‍රභවය වූ ජපානය 2020 වසරේ දී හයවැනි ස්ථානය වෙත පහත වැටුණු අතර, මේ සඳහා පැවති ආනයන සීමා කිරීම් හේතුවෙන් රථවාහන ආනයනය අඩුවීම හේතු විය.

## විදේශ වෙළඳ ප්‍රතිපත්ති, ප්‍රවණතා සහ ආයතනික සහාය

**කොවිඩ්-19 වසංගතය ගෝලීය ආර්ථිකයට සහ ලෝක වෙළඳාමට මින් පෙර නොවූ විරූ ආකාරයේ බලපෑමක් සිදු කළ අතර, එහි අහිතකර බලපෑම් අවම කර ගැනීම උදෙසා රජයට විවිධ පියවර අනුගමනය කිරීමට සිදු විය.** ඒ අනුව, බලපෑම් අවම කර ගැනීම උදෙසා කඩිනම් ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමට සමගාමීව, ආනයන විකල්ප හඳුන්වා දීම සහ අපනයන ප්‍රවර්ධනය තුළින් දේශීය නිෂ්පාදකයින්ට සහාය දක්වන වෙළඳ ප්‍රතිපත්තියක් දියත් කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු විය. 2020 අප්‍රේල් මාසයේ දී රජය විසින් තීරු බදු නිර්ණය කිරීමේ කමිටුවක් පත් කරන ලදී. ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් ගොඩනැගුණු මෙකී කමිටුවට රජයේ ප්‍රතිපත්ති රාමුවෙහි හඳුනාගත් පරමාර්ථයන් හා අනුගතවෙමින් වෙළඳ හා තීරු බදු ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේ වගකීම පැවරිණි. 2020 වසරේ මුල් භාගය තුළ ඇති වූ අතිශය අහිතකර ආර්ථික තත්ත්වයන් ආනයන සීමා කිරීම් ද ඇතුළත්ව දැඩි ක්‍රියාමාර්ග හඳුන්වා දීමට රජය සහ මහ බැංකුව යොමු කරවීය. තාවකාලික පිළියමක් ලෙස අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම විනිමය අනුපාතිකය සහ ගෙවුම් තුලනය මත වූ පීඩනය බොහෝ දුරකට අවම කිරීමට සමත් විය. 2019 වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වන කාලපරිච්ඡේදය තුළ ආනයන වියදමෙහි සමස්ත පහළ යැමෙන් සියයට 36කට පමණ (එ.ජ. ඩොලර් බිලියන 1.3ක් පමණ) දායක වූයේ ආනයන සීමා කිරීමට ලක් වූ භාණ්ඩයි. වසර 28කට පසුව පළමු වරට අපනයන සංවර්ධන අමාත්‍ය සභාව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020 සැප්තැම්බර් මස රැස් විය. ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටු දැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය 2021 වසරේ දී අපනයන ආදායම සහ අනෙකුත් ණය නොවන විදේශ විනිමය ලැබීම් ප්‍රවර්ධනය උදෙසා අදාළ පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්න තුළින් ඉලක්කගත ක්‍රමවේදයක් සඳහා අනුගත කිරීම පිළිබඳ අවධානය යොමු කළේය.

**2020 වසරේ දී විදේශ අංශයට සපයන ලද ආයතනික සහාය වැඩිදියුණු කිරීම සඳහා විවිධ පියවර ගනු ලැබීය.** කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් බලපෑමට ලක් වූ අපනයන අංශ නැවත නගා සිටුවීම සඳහා විශේෂ අවධානය යොමු කරමින්, අපනයන සංවර්ධන මණ්ඩලය, 2018-2022 ජාතික අපනයන ක්‍රමෝපාය අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. මේ අතර, අපනයන සංවර්ධන මණ්ඩලය, වසංගත කාලසීමාව තුළ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් අන්තර්ජාල ක්‍රම උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කළේය. අපනයන සංවර්ධනය සඳහා වාණිජ මණ්ඩල ද දායක වූ අතර, එය ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ගැටළු නිරාකරණයේ දී රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධ කරවීමට උපකාරී විය. ජාතික ප්‍රමිතීන් සම්පාදනය සහ යාවත්කාලීන කිරීම හේතුවෙන් දේශීය නිෂ්පාදිතයන්ට විදේශීය නිෂ්පාදන හා තරග වැදීමට හැකියාව හිමි විණි. ඒ අනුව, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල වීමට ජාතික ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම උදෙසා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 2020 වසර

5

අවසානය වන විට ප්‍රමිතීන් 327ක් ප්‍රකාශ කර ඇත. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අනුකූලව, ශ්‍රී ලංකා රේගුව සිය ක්‍රියාකාරකම් තවදුරටත් විධිමත් කළේය. ඒ අනුව, පද්ධති පදනම් කරගත් පශ්චාත් නිෂ්කාශන විගණනයක් ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් රේගු ක්‍රියාපටිපාටි තවදුරටත් සරල කිරීමට සහ අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යන අතරම පහසුකම් සැපයීමේ පිරිවැය අවම කිරීමට ශ්‍රී ලංකා රේගුවට අවස්ථාව සැලසෙයි. රේගු ප්‍රකාශයන්ගේ පරිලෝකනය (ස්කෑන්) කළ ඡායාරූප හැසිරවීම සඳහා රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) යාවත්කාලීන කරන ලද අතර, කොවිඩ්-19 ආශ්‍රිතව සමාජ ආර්ථික කටයුතු සීමා කළ කාල වකවානුව තුළ දී පවා බාධාවකින් තොරව කටයුතු කිරීමට මෙමගින් ශ්‍රී ලංකා රේගුවට හැකියාව ලැබිණි. මේ අතර, ශ්‍රී ලංකා රේගුව නවීකරණය කිරීමේ වැඩසටහන අධ්‍යයනය කිරීම සහ උපදෙස් දීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, ශ්‍රී ලංකා රේගුව සහ ඒ ආශ්‍රිත කටයුතු විශ්ලේෂණයට සහ අදළ කටයුතු වාර්තා කිරීමට ජනාධිපති විමර්ශන කොමිසමක් 2021 පෙබරවාරි මාසයේ දී ස්ථාපනය කර ඇත. එමගින් ශ්‍රී ලංකා රේගුවේ කාර්යයන් වැඩිදියුණු කිරීම සහ ආදායම් කාන්දු වීම නතර කිරීමට අරමුණු කර ඇත.

**සමස්ත අපනයන ආදායම පහත වැටීමට සමගාමීව 2020 වසරේ දී වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන ද**

### 5.7 සංඛ්‍යා සටහන
### ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

| වරණීය වෙළඳ ගිවිසුම | 2019 | 2020 (අ) | | | ප්‍රධාන අපනයන නිෂ්පාදන (අපනයන ප්‍රමාණ අනුව අනුපිළිවෙලින්) |
|---|---|---|---|---|---|
| | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වර්ධනය (%) | දායකත්වය (%) | |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) | 4,020.0 | 3,671.8 | -8.7 | 83.1 | ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර |
| එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ) | 2,766.3 | 2,597.9 | -6.1 | 58.8 | ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 709.4 | 585.7 | -17.4 | 13.2 | ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, කුළුබඩු, රසායනික නිෂ්පාදිත |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 150.3 | 142.2 | -5.4 | 3.2 | තේ, රබර් නිෂ්පාදිත, ඇඟලුම්, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත |
| තුර්කිය | 85.3 | 80.3 | -5.9 | 1.8 | තේ, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ඇඟලුම්, රෙදිපිළි |
| ඕස්ට්‍රේලියාව | 89.7 | 79.2 | -11.8 | 1.8 | ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත |
| ජපානය | 84.9 | 71.0 | -16.4 | 1.6 | තේ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත |
| කැනඩාව | 73.5 | 61.0 | -17.0 | 1.4 | රබර් නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත / ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ඇඟලුම්, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ |
| වෙනත් ජී.එස්.පී. ක්‍රම | 60.6 | 54.6 | -9.9 | 1.2 | |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි | 489.6 | 358.4 | -26.8 | 8.1 | සත්ත්ව ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, කුළුබඩු, දැව හා කඩදාසි නිෂ්පාදිත |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි | 179.3 | 204.7 | 14.2 | 4.6 | ඇඟලුම්, තේ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි | 80.5 | 89.5 | 11.2 | 2.0 | කුළුබඩු, මූල ලෝහ හා උපාංග, පොල් මද ආශ්‍රිත / ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, සත්ත්ව ආහාර |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි | 60.8 | 53.0 | -12.8 | 1.2 | සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, ස්වාභාවික රබර්, පොල් මද ආශ්‍රිත නිශ්පාදිත, දැව හා කඩදාසි නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි | 55.9 | 42.2 | -24.4 | 1.0 | කුළුබඩු, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග, රෙදිපිළි, දැව හා කඩදාසි නිෂ්පාදිත |
| සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි | 1.7 | 0.8 | -55.6 | 0.02 | රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, රෙදිපිළි, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත |
| **වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන** | 4,887.8 | 4,420.4 | -9.6 | 100.0 | |
| **ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස** | 40.9 | 44.0 | | | |

(අ) තාවකාලික
(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ. එක්සත් රාජධානියද ඇතුළත් වේ.
(ඇ) රුසියාව, බෙලාරූස් හා කසකස්ථානය ඇතුළත් වේ.
(ඈ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: වාණිජ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

5

**පහළ ගියේය.** සමාලෝචනයට ලක්වන කාලය තුළ, වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රම (ජී.එස්.පී) යටතේ වෙළඳාම් සිදු කෙරෙන ප්‍රධාන හවුල්කරුවන් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමග සිදු කළ ක්‍රියාකාරකම් තුළින් වෙළඳපොළ පිවිසුම් අවස්ථා තවදුරටත් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරිණි. 2020 වසරේ ජූලි මාසයේ දී පහළ මැදි ආදායම් ලබන රටක් ලෙස නැවත වර්ගීකරණය වීමත් සමග යුරෝපා සංගමයේ වත්මන් විශේෂ ප්‍රතිලාභයන් සහිත වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රමයේ (ජී.එස්.පී ප්ලස්) වලංගු කාලසීමාව වන 2023 වසර ඉක්මවන තෙක් ශ්‍රී ලංකාව එහි ප්‍රතිලාභ අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් ලබා දුන් ජී.එස්.පී යෝජනා ක්‍රමය 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වුව ද, ඇමෙරිකා එක්සත් ජනපද රජයේ සාමාන්‍ය පිළිවෙත අනුව නැවත වරක් එම පහසුකම් ප්‍රතිස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 මාර්තු 31 වන දිනෙන් වලංගු කාල සීමාව අවසන් වූ ජපානය විසින් ලබා දෙන ලද ජී.එස්.පී යෝජනා ක්‍රමය, මේ වන විට සමාලෝචන ක්‍රියාවලියකට ලක් වෙමින් පවතී. අපනයන සඳහා දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පැවතිය ද, රුසියානු සමූහාණ්ඩුව, තුර්කිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්විට්සර්ලන්තය, නෝර්වේ සහ නවසීලන්තය ආදී වූ රටවල් බොහොමයක් ලබා දුන් ජී.එස්.පී යෝජනා ක්‍රම මගින් ද ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබීය. 2021 ජනවාරි මස 01 වන දින සිට යුරෝපා සංගමයේ තීරු බදු ක්‍රමයෙන් පරිබාහිරව එක්සත් රාජධානියේ නව ගෝලීය තීරු බදු යෝජනා ක්‍රමය (UKGT) බලාත්මක විය. කෙසේ වුවද, යුරෝපා සංගමයේ ජී.එස්.පී ප්ලස් යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට තීරු බදු රහිත වෙළඳපොළ ප්‍රවේශය හිමිව පවතින තුරු ජී.එස්.පී යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබා එක්සත් රාජධානියට අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා තීරු බදු රහිත වෙළඳපොළ ප්‍රවේශය අත් විඳිය හැකිව ඇත. ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබුව ද, මෙම නිදහස් වෙළඳ ගිවිසුම් මගින් 2020 වසරේ සිදු කළ අපනයන පහළ ගියේය. කෙසේ වුවද, 2020 වසරේ දී, ඉන්දියාව සහ පාකිස්ථානය වෙත නිදහස් වෙළඳ ගිවිසුම් හරහා සිදු කළ අපනයන ඉහළ මට්ටමක පැවති අතර, ඉන්දියාව සහ පකිස්ථානය වෙත නිදහස් වෙළඳ ගිවිසුම් හරහා සිදු කළ අපනයන, එම රටවල් වෙත වූ සමස්ත අපනයනවලින් කොටසක් ලෙස පිළිවෙළින්, සියයට 59ක් සහ සියයට 71ක් විය. මේ අතර, 2020 වසර තුළ දී, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ ආනයන අඛණ්ඩව පහළ අගයක පැවති අතර, එම ප්‍රමාණයන් ඉන්දියාවෙන් සිදු කරන ලද මුළු ආනයනවලින් සියයට 5.2ක් (එ.ජ. ඩොලර් මිලියන 159ක්) සහ පාකිස්ථානයෙන් කරන ලද මුළු ආනයනවලින් සියයට 3.3ක් (එ.ජ. ඩොලර් මිලියන 11ක්) ලෙස වාර්තා විය. කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (චීනය, දකුණු කොරියාව සහ බංගලාදේශයට අපනයනය ඉහළ යෑම හේතුවෙන්) සහ ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) (පේරු රාජ්‍යයට කුරුඳු අපනයනය ඉහළ යෑම හේතුවෙන්) යටතේ සිදු කළ අපනයන 2020 වසරේ දී ඉහළ ගියේය. කෙසේ වුවද, 2020 වසරේ දී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) සහ දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ සිදු කළ අපනයන තවදුරටත් පහළ මට්ටමක පැවතුණ අතර, කලාපීය වෙළඳ සහ සේවා ජාලයන් අතර සහයෝගීතාවයේ වැදගත්කම සලකා බලා කලාපීය වරණීය වෙළඳ ගිවිසුම් හා සම්බන්ධතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මෙමගින් පෙන්වා දෙයි. නිෂ්පාදන විවිධාංගීකරණය පහළ මට්ටමක පැවතීම, වරින් වර සිදු වන ප්‍රතිපත්ති වෙනස් වීම් සහ කාර්ය පටිපාටි ප්‍රමාදවීම් වැනි බදු නොවන බාධක හේතුවෙන් ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම් මගින් පරිපූර්ණ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඇති අවස්ථාව මග හැරී ඇත. 2020 වසර තුළ, තෙවන පාර්ශ්වයක් විසින් නිෂ්පාදිත භාණ්ඩ ආනයනය කර නැවත වෙනත් අයුරකින් නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම් කිරීම හරහා නිදහස් වෙළඳ ගිවිසුම් මගින් ලබා දෙන සහන අවභාවිත කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා වළක්වාලීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. 2020 ජූනි මස පැවැත්වීමට නියමිතව තිබූ 12වන අමාත්‍ය මණ්ඩල සම්මන්ත්‍රණය, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේ ජූනි මස දක්වා කල් දැමුව ද, ලෝක වෙළඳ සංවිධානය සමග ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වීය සම්බන්ධතා 2020 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

**පාර්ශ්වකරුවන් අතර නිදහස් වෙළඳ ගිවිසුම්වල වැදගත්කම සම්බන්ධව පවත්නා අදහස් ඉතා විවිධාකාර වන නමුත්, එම ගිවිසුම්වල සඳහන් කොන්දේසි දේශීය ව්‍යාපාර හා ව්‍යවසායයන්ට අහිතකර නොවිය යුතු බවට පොදු පිළිගැනීමක් පවතී.** චීනය, ඉන්දියාව සහ

තායිලන්තය සමඟ යෝජිත හවුල්කාරීත්ව ගිවිසුම් හා සම්බන්ධ නිල ද්විපාර්ශ්වික සාකච්ඡා 2018 වසරේ සිට එතරම් ප්‍රගතියක් පෙන්නුම් කර නැත. 2020 වසර තුළ පැවැත්වීමට නියමිත වූ ද්විපාර්ශ්වික සහ කලාපීය ගිවිසුම් හා සම්බන්ධ සැලසුම් කළ සාකච්ඡා කොවිඩ්-19 වසංගත තත්ත්වය මත හටගත් දුෂ්කරතා හේතුවෙන් කල් දමූ අතර, ඇතැම් සාකච්ඡා අන්තර්ජාලය හරහා මංගත ක්‍රම ඔස්සේ පැවැත්වුණි. මෙයට අමතරව, සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA) පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් මතු කළ ගැටළු හේතුවෙන්, 2018/2019 කාලසීමාව තුළ, සමාලෝචනයක් සිදු කරන ලද අතර, එමගින් දැනට පවතින නිදහස් වෙළඳ ගිවිසුම සඳහා සංශෝධන නිර්දේශ කෙරිණි. ඒ අනුව, 2021 ජනවාරි මස කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය අනුව, යෝජිත සංශෝධන සිදු කිරීමට සහ සිංගප්පූරු රජය සමඟ සාකච්ඡා පැවැත්වීමට තාක්ෂණික සහාය කමිටුවක් ස්ථාපිත කරන ලදී. මේ අතර, ඉන්දියාව හා චීනය ඇතුළුව ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ පුළුල් වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ වාසි සහ අවාසි පිළිබඳව පාර්ශ්වකරුවන් විසින් විවිධ අදහස් ප්‍රකාශ කර ඇත. වෙළඳ සාකච්ඡා මගින් ශ්‍රී ලංකාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා විදේශිකයන් සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට පෙර අදාළ සියලු පාර්ශවකරුවන්ගෙන් උපදෙස් ලබා ගැනීම් සහ ජාතික අවශ්‍යතා පිළිබඳ පුළුල් එකඟතාවයකට එළඹීම අවශ්‍ය බව මෙමගින් පිළිබිඹු වේ. එම එකඟතාවය, දැනට සකස් කරමින් පවතින ජාතික වෙළඳ ප්‍රතිපත්තියේ අන්තර්ගත කළ යුතු අතර නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධ අනාගත ක්‍රියාමාර්ග ඉදිරියට රැගෙන යාමට එය ඉවහල් වනු ඇත.

### 5.2.2 සේවා ගිණුම

**කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී කැපී පෙනෙන ලෙස අඩු විය.** සංචාරක සහ ප්‍රවාහන සේවා ඉපැයීම් අඩු වීමත් සමඟ, සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.0කින් පමණ අඩු විය.

#### විදේශ ගමන් සහ සංචාරක සේවා

**2020 මාර්තු මස 18 වන දින සිට සියලුම මගී ප්‍රවාහන ගුවන් යානා සහ නැව් මෙරටට ඇතුළු වීම තාවකාලිකව අත් හිටුවීම සහ විදේශිකයන් සඳහා සංචාරක වීසා නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන් 2020 වසර තුළ දී සංචාරක සේවා ඉපැයීම්හි විශාල පසුබෑමක් වාර්තා විය.** වසර තුළ පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 507,704කට සීමා වූ අතර, වසරේ පළමු මාස තුන තුළ පැමිණි සංචාරකයින් 507,311ක් සහ දෙසැම්බර් මස අග ජෛව බුබුළු සංකල්පය මත පදනම් වූ නියමු ව්‍යාපෘතිය යටතේ මෙරටට පැමිණි යුක්රේන ජාතික සංචාරකයින් 393ක් ද මීට ඇතුළත් විය. ඒ අනුව, සංචාරක පැමිණීම් පෙර වසරට සාපේක්ෂව සියයට 73.5කින් පහළ වැටීමක් වාර්තා කළේය. සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තු කෙරෙන සංචාරක සේවා ආදායම 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 682ක් දක්වා සියයට 81.1ක පහළ යෑමක් පිළිබිඹු කළේය.

**කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ආපදාවට පත් වූ සංචාරක ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සඳහා සහය වීමේ පරමාර්ථයෙන් යුතුව රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව, 2019 වසරේ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ට පසුව හඳුන්වා දුන් සහන දීර්ඝ කිරීම ද ඇතුළු ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කළේය.** පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් විසින් ණය සහ පොලී ගෙවීම සඳහා 2020 මාර්තු 31 දින දක්වා ලබා දී තිබූ සහන කාලය වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයට සිදු වූ අහිතකර බලපෑම සලකා බලා 2021 මාර්තු 31 දින දක්වා දීර්ඝ කරන ලදී. මෙකී සහන කාලය නැවත වතාවක් 2021 අප්‍රේල් මස 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි තවත් හය මසකට දීර්ඝ කරන ලදී. මෙම ණය සහ පොලී ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාලයට සමගාමීව, සංචාරක අංශයේ වාහන සඳහා කල්බදු වාරික ගෙවීමට ද සහන කාලයක් ලබා දී එය ද දීර්ඝ කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කළ කොවිඩ්-19 සෞභාග්‍යා පුනරුද සහන ණය පහසුකම යටතේ සංචාරක අංශයේ නියුතු පුද්ගලයන්ට සහ ව්‍යාපාරයන්ට සියයට 4.00ක පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබා ගැනීමට අවස්ථාව සැලසුණු අතර, මෙමගින් සංචාරක අංශයේ බොහෝ පාර්ශ්වකරුවන් හට තම ද්‍රවශීලතාවය සහ නුබුන්වත් බව රැකගැනීමට සහ රැකියා අවස්ථා පවත්වා ගෙන යෑමට හැකි විය. සංචාරක අංශයේ රැකියාවන්හි නියුතු විවිධ පාර්ශ්වයන්ට සහන රැසක් රජය විසින් ද හඳුන්වා දෙන ලදී. රජය විසින් නිරෝධායන මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම සඳහා සංචාරක අංශයට අවසර දෙනු ලැබූ අතර ඊට අදාළ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන් සහ පරීක්ෂා කිරීම් ද හඳුන්වා දෙනු ලැබීම මෙම කාලසීමාව තුළ සංචාරක ක්ෂේත්‍රයට යම් ප්‍රමාණයක සහායක් විය. 2020 මාර්තු 01 දින සිට 2021 පෙබරවාරි 28 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ විදුලි බිල්පත් 2021 අප්‍රේල් 01 දින සිට වාරික

වශයෙන් ගෙවීමට අවස්ථාව සැලසෙන පරිදි සහන කාලයක් ලබා දී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක මගපෙන්වන්නන් සහ රියදුරන් හට එක් වරක් සිදු කළ ගෙවීම් මෙන්ම නවාතැන්හල්, සංචාරක නියෝජිතයන්, සංචාරක මග පෙන්වන්නන් සහ රියදුරන්ගෙන් අය විය යුතු වාර්ෂික අලුත් කිරීමේ ගාස්තු කපා හැරීම සහ සංචාරක ක්ෂේත්‍රයේ අවිධිමත් අංශයට සහාය වීම සඳහා කොන්දේසි සහිතව ලියාපදිංචි කිරීම ඇතුළු පහසුකම් මෙම වසර තුළ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්, ආගන්තුක නිවාස, අවන්හල් හෝ ඒ හා සමාන සේවා සපයන අනෙකුත් ආයතන 2019 දෙසැම්බර් සිට එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක නියෝජිතයන් විසින් විදේශිකයන් සඳහා රට තුළ ක්‍රියාත්මක කරනු ලබන සංචාර 2020 අප්‍රේල් මස සිට එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම ද මෙම අංශයට සහයක් විය.

**දේශීය ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහා රජය විසින් පෞද්ගලික අංශය සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලැබූ නවමු ආකාරයේ වැඩසටහන් හේතුවෙන් 2021 ජනවාරි මස සංචාරකයින් සඳහා රට විවෘත කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය.** සංචාරක අමාත්‍යාංශය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහය ඇතිව සංචාරක ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමත් සමඟ, 2020 අගෝස්තු මාසයේ දී ලෝක සංචාරක කවුන්සිලය විසින් සංචාරය සඳහා ආරක්ෂිත රටක් ලෙස ශ්‍රී ලංකාවට

**5.10 රූප සටහන**
**සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ආරක්ෂිත සංචරන මුද්‍රාව ලබා දෙන ලදී. සෞඛ්‍යාරක්ෂිත හා සුරක්ෂිතභාවය පිළිබඳ සහතිකකරණය සඳහා විස්තරාත්මක විගණනවල යෙදීම උදෙසා ස්වාධීන විගණන ආයතනයක් පත් කරන ලද අතර, හෝටල් සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශ අනුගමනය කරනු ලබන ආකාරය පිළිබඳ තම අත්දැකීම් ඉදිරිපත් කිරීම සඳහා සංචාරකයන්ට අවස්ථාව සැලසෙන පරිදි QR කේතයක් ද එහි ඇතුළත් වේ. මෙම විගණන සඳහා වන පිරිවැය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දරනු ලබයි. මෙම ක්‍රියාමාර්ගයන්ට සහයෝගය සපයමින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා එක්ව 'ශ්‍රී ලංකා සංචාරක යෙදවුම - ජංගම අනුවාදය 0' නම් යෙදවුමක් ද නිර්මාණය කරමින් පවතී. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රොනික ගමනාන්ත අවසරපත සඳහා වන වෙබ් අඩවියට ද සම්බන්ධ කිරීමට අදහස් කෙරෙන මෙම යෙදවුම හරහා සංචාරකයින් හට අවශ්‍ය තොරතුරු ලබා දෙන අතර ම, සෞඛ්‍යාරක්ෂණ නියමයන් අනුගමනය කිරීම හා සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යෑම ද අදහස් කෙරෙයි. මෙම පසුබිම තුළ ජෛව බුබුළු සංකල්පය යටතේ සංචාරකයින් මෙරටට ගෙන්වීමේ නියමු වැඩසටහනක් 2020 දෙසැම්බර් මස රජය විසින් ආරම්භ කරනු ලැබීය. මෙම සංකල්පය යටතේ, අනුමත හෝටල්වල පමණක් සංචාරකයන්ට නවාතැන් ගත හැකි අතර, අනුමත දිනයන්හි දී නියාමනය කරනු ලබන ප්‍රවාහන මාධ්‍යයන් උපයෝගී කර ගනිමින් සංචාරක ස්ථානයන් වෙත ගමන් කළ හැකිය. එමනිසා, ප්‍රජාව සමඟ සංචාරකයන් ගැවසීමක් සිදු නොවන අතර, සංචාරකයින්ට ද, සාම්ප්‍රදායික නිරෝධායන රීතිය වන එක් ගොඩනැගිල්ලක හෝ එක් ස්ථානයක දින 14ක් රැඳී සිටීමේ අවශ්‍යතාවය ඇති නොවේ. මෙම ජෛව බුබුළු නියමු ව්‍යාපෘතිය යටතේ 2020 වසරේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් 393 හැරුණු විට 2021 වසරේ පළමු මාස තුන තුළ තවත් සංචාරකයෝ 9,629ක් මෙරටට පැමිණියහ. මේ අතරතුර, 2020 වසර තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය එ.ජ. ඩොලර් මිලියන 118ක වටිනාකමකින් යුතු ව්‍යාපෘති 29ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර, එයින් බහුතරය සංචාරක කටයුතු හා සම්බන්ධ ඉදි කිරීම් සඳහා වේ. තවද, පළාත් පාලන ආයතනයන්ගේ සහයෝගය ඇතිව සංචාරකයන් අතර දැනට ප්‍රචලිත නොවන ස්ථාන සංවර්ධනය කිරීමට මෙන්ම දැනට සංචාරකයන් අතර ප්‍රචලිත ස්ථාන සහ

5

ආකර්ෂණයන් තවදුරටත් සංවර්ධනය කිරීමට ද කටයුතු කරන ලදී. පළාත් පාලන ආයතන විසින් යෝජනා කරනු ලැබූ සංචාරක ආකර්ෂණයන් පදනම් කරමින්, පළාත් නමය ආවරණය වන පරිදි, 'ජාතික තිරසාර ගමනාන්ත සහතිකකරණය' සිදු කිරීමට පියවර ගනු ලැබීය. රාජ්‍ය ආයතන විසින් පෞද්ගලික අංශය සමඟ එක්ව ස්ථාපිත කරනු ලැබූ මෙම සංචාරක ප්‍රවර්ධන උපායමාර්ග සමඟ 2021 වසරේ සංචාරක ක්ෂේත්‍රයේ ආදායම ක්‍රමිකව සාමාන්‍ය තත්ත්වයට පැමිණීමක් අපේක්ෂා කෙරෙන අතර, ඉන් අනතුරුව, ලොව පුරා එන්නත්කරණ වැඩසටහන් හේතුවෙන් වසංගත බිය දුරු වීමත් සමඟ සංචාරක පැමිණීම්හි සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කෙරේ.

### ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා සහ අනෙකුත් සේවා

**ගෝලීය සැපයුම් දාමයන්ට සිදු වූ බාධාවන් හේතුවෙන් ප්‍රවාහන අංශයේ ඉපැයීම් සැලකිය යුතු ලෙස පහළ ගිය වාතාවරණයක් තුළ 2020 වසරේ දී සේවා අංශයේ ඉපැයීම් සඳහා ප්‍රමුඛව දයක වූයේ පරිගණක සහ තොරතුරු සේවා උප අංශය යි.** විශේෂයෙන්ම 2020 වසරේ වසංගතය ව්‍යාප්ත වූ මුල් කාලපරිච්ඡේදයෙන් පසු තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම හා සම්බන්ධ සේවා කැපී පෙනෙන ලෙස වර්ධනය වීම හේතුවෙන් වසර තුළ දී, පරිගණක සේවා උප අංශය ඉහළ ආදායම් ලැබීමක් වාර්තා කළේය. සැපයුම් දාමවලට සිදුවූ බාධාවන් සහ ප්‍රධාන වශයෙන්, අත්‍යවශ්‍ය නොවන ආනයන විශේෂයෙන් මෝටර් රථ ආනයනය සීමා කිරීම හේතුවෙන් කොළඹ සහ හම්බන්තොට වරායේ බහලු හැසිරවීමේ කැපී පෙනෙන පහළ යෑමක් මෙන්ම ප්‍රතිනැව්ගත කිරීමේ යම් අඩු වීමක් දක්නට ලැබුණි. වසංගත තත්ත්වය හමුවේ සංචාරක පැමිණීම් ඇනහිටීම හේතුවෙන් ගුවන් මගී සේවා ගාස්තු ඉපැයීම් සැලකිය යුතු ලෙස පහළ ගියේය. වසංගතය හේතුවෙන් අනේවාසික ගුවන් සේවා මෙහෙයුම් සීමා වීම හමුවේ මගී ප්‍රවාහන සේවා ගෙවීම් ද අඩු විය. 2020 වසරේ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් අවම වීම හේතුවෙන්, රක්ෂණ, මූල්‍ය සේවා, ඉදි කිරීම් සේවා සහ වෙනත් ව්‍යාපාර සේවා ඇතුළු අනෙකුත් උප අංශ බොහොමයක ඉපැයීම් සහ ගෙවීම් පහළ යෑම් වාර්තා විය. මෙම ප්‍රවණතා හමුවේ, සේවා ගිණුමේ අතිරික්තය 2019 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,849 හා සැසඳීමේ දී 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 819ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

### 5.2.3 ප්‍රාථමික ආදායම

**පසුගිය දශකය පුරා අඛණ්ඩව ඉහළ ගිය ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2020 වසරේ දී කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කළේය.** රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන සඳහා පොලී හා කූපන ගෙවීම් කැපී පෙනෙන ලෙස පහළ යෑම සහ විදේශීය ඍජු ආයෝජන සමාගම්වල ලාභාංශ ගෙවීම් හා ප්‍රතිආයෝජිත ඉපැයීම් අඩු වීම, මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී, අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් කූපන ගෙවීම් සහ පොලී ගෙවීම් කැපී පෙනෙන ලෙස අඩු විය. වසර තුළ දී නේවාසික බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් ද්විතීයික වෙළඳපොළ තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ දී අනේවාසිකයින්ට ගෙවනු ලැබූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත වූ කූපන ගෙවීම් සුළු වශයෙන් වැඩි විය. තවද, රජයේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය ඉහළ යෑමත් සමඟ, මෙම වසර තුළ දී රජයේ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ ගිය ද, පෞද්ගලික අංශය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් අඩු විය. මෙම ප්‍රවණතාවල ඒකාබද්ධ බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස, සමස්තයක් වශයෙන් 2020 වසරේ දී විදේශීය ණය මත ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව අඩු විය. ප්‍රතිආයෝජිත ඉපැයීම් සහ ඍජු ආයෝජන ව්‍යාපාර විසින් සිදු කළ ලාභාංශ ගෙවීම් සැලකිය යුතු ලෙස අඩු වීම ද ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වීමට දයක විය. විදේශීය ඍජු ආයෝජන පොදුවේ අඩු වීමට සමගාමීව, ප්‍රාථමික ආදයම් ගිණුමේ ගෙවීමක් ලෙස සැලකෙන විදේශීය ඍජු ආයෝජන ආකාරයෙන් වූ ප්‍රතිආයෝජිත ඉපැයීම් 2020 වසරේ දී අඩු විය. ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන් ඍජු ආයෝජන ව්‍යාපාර විසින් සිදු කළ ලාභාංශ ගෙවීම් පෙර වසරට සාපේක්ෂව පහළ ගිය අතර, එය ප්‍රාථමික ආදයම් ගිණුමේ හිඟය අඩු වීම කෙරෙහි යහපත් ලෙස දායක විය. රජය මෑදිකාලීනව විදේශීය ණය මත වැඩි වශයෙන් යොමු වීම තවදුරටත් සීමා කිරීමට උත්සාහ දැරීම මත, ඉදිරි කාලයේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් සලකා බැලීමේ දී, 2020 වසර තුළ දළ නිල සංචිත පහළ යෑමට සමගාමීව සංචිත වත්කම් ආයෝජනය තුළින් උපයන ලද ඉපැයීම් අඩු විය.

## විශේෂ සටහන 4
## විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ: ප්‍රවණතා, ගැටලු සහ ඉදිරි දැක්ම

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි විදේශ විනිමය ලැබීම් සඳහා දායක වූ විශාලතම තනි මූලාශ්‍රය විය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ගෝලීය විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී වේ යැයි පැවති අපේක්ෂාවන්ට ප්‍රතිවිරුද්ධව, වසරේ පළමු භාගයේ දී වාර්තා වූ පසුබෑමෙන් පසු වේගයෙන් යථා තත්ත්වයට පැමිණීමක් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාව සහ තවත් දකුණු ආසියානු රටවල් කිහිපයක් 2020 වසර තුළ දී ඉහළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් වාර්තා කරමින් කැපී පෙනෙන ලෙස ඉස්මතු විය. මෙවන් පසුබිමක දී, ණය බර ඇති නොකරන විදේශ මූල්‍යකරණ ප්‍රභවයක් ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ඇති වැදගත්කම මෙන්ම, රට තුළට විදේශ විනිමය ගලා එන තිරසාර මූලාශ්‍රයක් බවට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය කිරීමේ දී විසඳිය යුතුව ඇති රැකියා සඳහා විදේශගත වීම් හා සම්බන්ධ සමාජ ආර්ථික ගැටලු හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමේ දී මුහුණ දෙන අභියෝග සහ එහි ප්‍රවර්ධනය සඳහා ගත යුතු පියවර ඉස්මතු කරමින්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හා සම්බන්ධ මෙතෙක් වාර්තා වූ ප්‍රවණතා සහ එහි ආර්ථික ප්‍රතිලාභ මෙන්ම, රැකියා සඳහා විදේශගත වීම ආශ්‍රිත සමාජීය කරුණු මෙම සටහන තුළින් සාකච්ඡා කෙරේ.

### විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල මෙතෙක් වාර්තා වූ ප්‍රවණතා

වෙළඳ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයන් හේතුවෙන් ඇති වන ජංගම ගිණුමේ හිඟය අවම කිරීම සඳහා බොහෝ කලක සිට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ දායක විය. විදේශීය ජංගම ගිණුමෙහි ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම් අතුරින් සියයට 100ක් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් සමන්විත වේ.

රූප සටහන වි.ස. 4.1
ජංගම ගිණුමේ සංයුතිය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පසුගිය දශක දෙකක කාලය පුරා, සාමාන්‍යයක් ලෙස, විදේශීය ජංගම ගිණුමේ සමස්ත ලැබීම්වලින් හතරෙන් එකක් පමණ විදේශ සේවා නියුක්තිකයින්ගේ වාර්ෂික ප්‍රේෂණවලින් සමන්විත වූ අතර, 2020 වසරේ දී මෙම ප්‍රමාණය කැපී පෙනෙන ලෙස තුනෙන් එකක් ඉක්මවා යාම (සියයට 35ක්) තුළින් විදේශීය අංශය මුහුණ දෙන අවදානම් මගහරවා ගැනීමේ දී සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යෑමේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් ලැබෙන පිටුබලයෙහි ඇති වැදගත්කම පිළිබිඹු වේ. වෙළඳ හිඟය මූල්‍යායනය කිරීම සඳහා වන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, පසුගිය දශක දෙක පුරා, සාමාන්‍යයක් වශයෙන්, වෙළඳ ගිණුමේ වාර්ෂික හිඟයෙන් සියයට 80ක් පමණ ආවරණය කර ඇති අතර, 2020 වසරේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වෙළඳ හිඟය ඉක්මවා යමින් වෙළඳ ගිණුමේ හිඟයෙන් සියයට 118ක් පමණ විය. 2020 වසරේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යෑම, සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස පහළ යෑමෙන් වූ බලපෑම අවු කිරීමට උපකාරී විය.

රූප සටහන වි.ස. 4.2
විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1981-2000 කාලය තුළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් සියයට 5.7ක් පමණ වූ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2001-2020 කාලය තුළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.0ක් දක්වා ඉහළ යෑමෙන් ශ්‍රී ලංකාවේ ද.දේ.නි.යට සාපේක්ෂව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ඇති වැදගත්කම ඉහළ යෑම පිළිබිඹු කෙරෙයි. කෙසේ වුවද, 2016 සහ 2020 වසරවල හැරුණු විට පසුගිය වසර හය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ යෑමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. 2020 වසරේ දෙවන භාගයේ දී, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ශ්‍රී ලංකා ඉතිහාසයේ මාසයක් තුළ වාර්තා වූ ඉහළම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා විය. ඒ අනුව, 2020 වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ

5

**රූප සටහන වි.ස. 4.3**
**දකුණු හා ගිනිකොණදිග ආසියාවේ ඉහළම ප්‍රේෂණ ලබන රටවල් - 2019**




මූලය: ලෝක බැංකුව

එ.ජ. ඩොලර් බිලියන 7.1ක් දක්වා, පෙර වසර හා සැසඳීමේ දී සියයට 5.8කින්, ඉහළ ගියේය. 2020 වසරේ තුන්වන කාර්තුවේ සිට, බංගලාදේශය සහ පාකිස්ථානය වැනි කලාපයේ වෙනත් රටවල ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ යම්තාක් දුරකට යථා තත්ත්වයට පත් වීම ආරම්භ වී ඇති බව පෙන්නුම් කෙරේ.

ගෝලීය වශයෙන් සැලකීමේ දී, ඉහළම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබෙන රටවල් අතර ආසියානු රටවල් කිහිපයක් මුල් තැන ගනියි. 2019 වසරේ එ.ජ. ඩොලර් බිලියන 83ක් වාර්තා කරමින් ඉන්දියාව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබෙන ලොව ප්‍රමුඛතම රට බවට පත් වූ අතර, ඉහළම ප්‍රේෂණ ලබන රටවල් දහය අතරට, චීනය, පිලිපීනය, පාකිස්ථානය, බංගලාදේශය සහ වියට්නාමය ද ඇතුළත් වේ (World Bank, 2019). දකුණු ආසියානු සහ ගිනිකොණදිග ආසියානු කලාපවල රටවල් හා සැසඳීමේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල නාමික අගය අනුව ශ්‍රී ලංකාව පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කළ ද, ද.දේ.නි.යට සාපේක්ෂව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකීමේ දී ශ්‍රී ලංකාව, කලාප දෙකෙහිම ඉහළම ප්‍රේෂණ ලබන රටවල් අතර මුල් ස්ථාන පහ තුළ රැඳී සිටියි.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ආර්ථික ප්‍රතිලාභ සහ රැකියා සඳහා විදෙස්ගත වීම හා බැඳුණු සමාජීය කරුණු**

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, විශේෂයෙන්ම, පහළ සහ මැදි ආදායම් ලබන ශ්‍රී ලංකාව වැනි රට වලට පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි සහ නිත්‍ය ප්‍රතිලාභ අත්කර දෙයි. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, ලබන්නන්ගේ ආදායම් ඉහළ නැංවීමට උපකාරී වෙමින් ඉහළ සාධනීය බලපෑම් ඇති කරන අතර, ප්‍රේෂණ ලැබෙන රටෙහි විදේශ විනිමය සංචිත වැඩිදියුණු කිරීමට ද දායක වේ (Ratha and Maimbo, 2005). තවද, කාලානුරූපීව වෙනස් වීමට පෙළඹීමක් සහිත ප්‍රාග්ධන ප්‍රවාහ මෙන් නොව, සාපේක්ෂව ස්ථාවර විදේශ විනිමය ප්‍රවාහයක් සහිත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, පරිභෝජනය සුමට කිරීමට නිතර සහය වන අතර, ආර්ථික අර්බුද අවස්ථාවල දී සහ ස්වාභාවික උපද්‍රවවලින් පසුව රක්ෂණයක් ලෙස කටයුතු කරයි (Bettin and Zazzaro, 2016 and De et al., 2016, cited in World Bank, 2019). ප්‍රතිලාභ හිමිවන කුටුම්භවල දරිද්‍රතාවය අවම කිරීම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සතු හැකියාව හේතුවෙන්, එය විවිධ අංශයන් වෙත සෞභාග්‍යය ව්‍යාප්ත කිරීමේ මාර්ගයක් ද වී ඇත.

විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම සමඟ නිරන්තරයෙන් බැඳුණු සමාජීය සහ මූල්‍ය පිරිවැය, එමගින් රටට ලබා ගත හැකි ප්‍රතිලාභ උපරිම වශයෙන් අත්කර ගැනීමට බාධා පමුණුවයි. විදේශ සේවා නියුක්තිය හා සබැඳි ප්‍රමුඛතම පිරිවැය වනුයේ, පවුලේ සාමාජිකයින්ගේ, විශේෂයෙන්ම මෙරට නතිවන කුඩා දරුවන්ගේ, සුභ සාධනය මත වන බලපෑමෙන් ඇති වන සාමාජීය පිරිවැයයි. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ, විශේෂයෙන්ම මව විදේශ රැකියාවක නිරත වන විට, දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය, පෝෂණය සහ ආරක්ෂාව බොහෝවිට අවදානමට ලක් වේ. තවද, ඇතැම් සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ මූල්‍ය සාක්ෂරතාවය අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, ඔවුන්ගේ ජීවන තත්ත්වයේ අපේක්ෂිත වර්ධනය ළඟාකර ගැනීම උදෙසා අවශ්‍ය ඵලදායී අරමුණු සඳහා ප්‍රේෂණ නිසි ලෙස කළමනාකරණය කිරීම දුර්වල මට්ටමක පවතියි. සමහර කුටුම්භවල පවුලේ සාමාජිකයන් විසින් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හෝ ආයෝජන අරමුණු සඳහා යොදා ගැනීම වෙනුවට මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනය කිරීම සඳහා යෙදවීම ගැටලුවක් ව පවතී. ගෘහ සේවය උදෙසා විදේශගත වන කාන්තාවන්ගේ පවුල්වල මෙම ගැටලු වඩාත් කැපී පෙනේ.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමට ඇති බාධා සහ ප්‍රතිපත්ති නිර්දේශ**

සමාජීය සාධක හැරුණු විට, රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ගේ ආදායම් ඉපැයීමේ හැකියාව ඉහළ නංවා ගැනීමට බාධා පමුණුවන වෙනත් සාධක රාශියක් ඇති අතර, එම කරුණු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා අයහපත් බලපෑම් එල්ල කරයි. රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ගේ නිපුණතා

සංකලනය අනුව, ශ්‍රී ලංකාව වැඩි වශයෙන් ගෘහ සේවය සඳහා විදේශගත වන කාන්තාවන් මත රඳා සිටින බව පැහැදිලිව දක්නට ලැබෙන කරුණකි. කෙසේ වුව ද, මීට දශක දෙකකට පමණ පෙර වාර්ෂිකව රැකියා සඳහා විදේශගත වන සමස්ත පුද්ගලයන් ප්‍රමාණයෙන් ඉහළම ප්‍රතිශතයකට හිමිකම් කියමින් සියයට 50කට වඩා වැඩි අගයක් වාර්තා කළ ගෘහ සේවිකා කාණ්ඩය 2020 වසර වන විට සියයට 30කට වඩා අඩු ප්‍රතිශතයක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. මීට ප්‍රතිවිරුද්ධව, මෙම කාලපරිච්ඡේදය තුළදී ම, වෘත්තීය සහ පුහුණු රැකියා කාණ්ඩ යටතේ වූ ශ්‍රම සංක්‍රමණයේ එකතුව සියයට 21 සිට සියයට 37ක් දක්වා ආසන්න වශයෙන් දෙගුණ වී ඇත. විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින්ගේ සංක්‍රමණයේ වර්ධන ප්‍රවණතාවයක් දක්නට ලැබුණ ද, ජාත්‍යන්තර රැකියා වෙළඳපොළේ ඇති ඉල්ලුම හා ශ්‍රී ලංකාවේ ශ්‍රම සැපයුම් හැකියාව අතර විශාල නොගැලපීමක් පවතී. ජනගහනය වයස්ගත වීම සහ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයේ ඉහළ යෑම ද ඇතුළු ජන විකසනයෙහි සිදු වන වෙනස් වීම් හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි හෙද සේවය සහ වැඩිහිටි සත්කාර ආදී වූ විශේෂීකරණ සේවා සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. ගෘහ සේවිකාවන්ට සාපේක්ෂව ඉහළ ආදායම් ඉපැයීමේ හැකියාවක් මෙවැනි රැකියාවලට ඇත. කෙසේ වෙතත්, කුසලතා පරතරය අවම කිරීම සඳහාත්, රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයින් විදේශ ශ්‍රම වෙළඳපොළ සඳහා සූදානම් කරවීම සඳහාත් අවශ්‍ය, විදේශ සේවා යෝජකයින් බලාපොරොත්තු වන ආකාරයේ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත සහතිකයක් ලබා දෙන, රැකියා ඉලක්ක කරගත් පුහුණුවක් ලබා දීම සඳහා වන පුහුණු ආයතන ශ්‍රී ලංකාව තුළ සීමා සහිතය.

විදේශ විනිමය ලැබීම් සම්බන්ධයෙන් සාපේක්ෂව ස්ථාවර මූලාශ්‍රයක් වුවද, විදේශ රැකියා සම්බන්ධයෙන් මැද පෙරදිග කලාපයේ රටවල් මත වැඩි වශයෙන් රඳා පැවතීම හේතුවෙන්, එම කලාපයේ රටවල ආර්ථික හා දේශපාලන අර්බුද හමුවේ එම රටවලින් ශ්‍රී ලංකාව වෙත ලැබෙන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ අවදානමකට ලක්වී ඇත. රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයින් සඳහා ප්‍රමුඛ වෙළඳපොළ මැද පෙරදිග කලාපය වන අතර, විදේශ රැකියා සඳහා වාර්ෂිකව පිටව යන ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණයෙන් සියයට 80-90කට ද, විදේශ සේවා නියුක්තිකයින්ගේ සමස්ත ප්‍රේෂණවලින් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයකට ද මෙම කලාපය දායක වේ. එම නිසා, 2015 වර්ෂයේ සිට ප්‍රේෂණවල වාර්තා වූ පහළ යෑමේ ප්‍රවණතාවය කෙරෙහි ඛනිජ තෙල් අපනයනය කරනු ලබන මැද පෙරදිග කලාපයේ රටවල ආදායම අඩු වීම යම් තාක් දුරකට හේතු වන්නට ඇත. මීට අමතරව, විදේශයන්හි සේවා නියුක්තිකයින් සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් නොමැති වීම විදේශ රැකියා අවස්ථා සෙවීමට ශ්‍රී ලාංකිකයන් අධෛර්යමත් කරයි. තවද, වසංගතයේ පළමු රැල්ලේ දී සමහර සේවා යෝජකයින් විදේශ සේවා නියුක්තිකයින්ගේ රැකියා අත්හිටුවා ඇති හෙයින්, කොවිඩ්-19 වසංගතය ද විදේශගත ශ්‍රමිකයින් කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන වූ සංචරණ සීමාවන් හේතුවෙන් මෙම රැකියා සඳහා විදේශගතව සිටි ශ්‍රී ලාංකික ශ්‍රමිකයෝ බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. වසංගත තත්ත්වයක් ඇතුළුව විවිධ හේතු මත සිය රැකියාව අහිමි වුවහොත්, විදෙස්ගත ශ්‍රමිකයින්ගේ දයකත්වය සහිතව ඔවුනට අවම වැටුපක් තහවුරු කෙරෙන සංක්‍රමණික රක්ෂණ වැඩපිළිවෙලක් හෝ ඔවුන්ගේ ජීවිතයේ සැඳෑ සමයේ දී අඛණ්ඩ ආදායමක් හිමිවන විශ්‍රාම ප්‍රතිලාභ වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක නොවේ.

අධික ප්‍රේෂණ පිරිවැය ලොව පුරා සංක්‍රමණික ශ්‍රමිකයින් මුහුණපාන ප්‍රධාන ගැටලු අතරින් එකකි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ඉදිරිපත් කර ඇති 2030 තිරසාර සංවර්ධන අරමුණු අතර, රටවල් තුළ සහ රටවල් අතර අසමානතා අවම කිරීම යන අරමුණ කරා ළඟා වීමට අවශ්‍ය ඉලක්කයක් ලෙස 2030 වසර වන විට ප්‍රේෂණ පිරිවැය සියයට 3ක් දක්වා අඩු කිරීම දක්වා ඇත. කෙසේ වුවත්, ප්‍රේෂණ පිරිවැය සාමාන්‍යයෙන් සියයට 6.51ක් ලෙස තවමත් ඉලක්කගත මට්ටමට වඩා ඉහළ අගයක පවතින අතර සාමාන්‍ය පිරිවැය සියයට 4.88ක් වාර්තා කරමින් විදේශ සේවා නියුක්තිකයින්ගේ ඉපැයීම්, අවම පිරිවැයක් යටතේ ප්‍රේෂණය කළ හැකි කලාපය ලෙස දකුණු ආසියාව රැඳී සිටී (World Bank, 2020).

විදේශ රැකියා නියුක්තිය සම්බන්ධයෙන් පවතින අභියෝග ජයගනිමින්, රට තුළට ගලා එන ප්‍රේෂණ වර්ධනය කර ගැනීමේ අරමුණින් රජය 2021 වසරේ අයවැය මගින් විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම සහ විදේශ රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය සඳහා සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ වැඩසටහනක් දියත් කිරීම, රැකියා සඳහා විදෙස්ගත වන ශ්‍රමිකයින් සඳහා දායකත්ව විශ්‍රාම යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ බලපත්‍රලාභී බැංකු වෙතින් විදේශ විනිමය ප්‍රේෂණ රුපියල් බවට හුවමාරු කිරීමේ දී සාමාන්‍ය විනිමය අනුපාතිකයට වඩා ඩොලරයට රුපියල් 2 ක් බැගින් ගෙවීම යනාදී ක්‍රියාමාර්ග එහි ඇතුළත් විය. තවද, 2020 වසරේ දී, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩි වශයෙන් රට තුළට ආකර්ෂණය කර ගැනීම සඳහා, රජය විසින්, මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ද උපදෙස් සහිතව, විශේෂ තැන්පතු ගිණුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එසේම, රජය, අනිකුත් අදාළ පාර්ශවකරුවන්ගේ ද සහයෝගයෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීම අරමුණු කර ගත් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවා ඇත.

**ඉදිරි දැක්ම**

වසංගත තත්ත්වය හමුවේ, ණය බර ඇති නොකරන විදේශ විනිමය මූලාශ්‍රයක් ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ඇති වැදගත්කම ඉහළ ගොස් ඇති අතර, එම ප්‍රේෂණ ලැබීම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. බැංකු අංශයට ඇති ප්‍රවේශය ඉහළ නැංවීම

5

උදෙසා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය, තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් ප්‍රේෂණ පිරිවැය සැලකිය යුතු ලෙස අවම කර ගැනීමටත්, ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමටත් හැකි වනු ඇති අතර, එය ප්‍රේෂණවලින් විශාල කොටසක් අවිධිමත් මූල්‍ය මාර්ග භාවිතයේ සිට විධිමත් මාර්ග භාවිතය වෙත යොමු කිරීම සඳහා පහසුකම් සලසනු ඇත. මංගත ප්‍රේෂණ හුවමාරු මාධ්‍යයන්, ජංගම දුරකථන හරහා සිදු කරන මුදල් ගනුදෙනු සහ මූල්‍ය තාක්ෂණ (Fintech) හරහා හුවමාරු කිරීම් ආදි වූ විද්‍යුත් මුදල් හුවමාරු ක්‍රම ප්‍රවර්ධනය ද ගනුදෙනු පිරිවැය අවම කිරීමට දායක වනු ඇත.

ඛනිජ තෙල් මිල උච්චාවචන සහ භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් නිරන්තර ආර්ථික අර්බුදවලට මුහුණ පාන මැද පෙරදිග කලාපය මත යැපීම වෙනුවට රැකියා සඳහා විකල්ප රටවල් සොයා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. මේ සම්බන්ධයෙන් ගත් විට, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ තනි කලාපයකින් ලැබීම අවම කර ගැනීම සඳහා, නව ශ්‍රම වෙළඳපොළ හඳුනා ගැනීම සහ සිංගප්පූරුව, ජපානය සහ යුරෝපීය රටවල් වැනි අනෙකුත් දියුණු ආර්ථික සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹීම අත්‍යවශ්‍ය වේ. වෘත්තීය පුහුණු කිරීම් ඔස්සේ නිපුණතා සංවර්ධනය උදෙසා ආයෝජන කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පුහුණුවක් ලබා දීම මගින් විදේශගත වීමට අපේක්ෂිත පුද්ගලයින්ගේ කුසලතා ක්‍රමිකව වර්ධනය කිරීම, ඉහළ සහ ස්ථාවර වැටුප් සහිත රැකියා අවස්ථා ලබා ගැනීමේ දී උපකාරී වේ. තවද, මෙරටින් පිටවීමට පෙර පවත්වන පුහුණු සැසි තුළ දී, භාෂා ප්‍රවීණතාවය සහ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමටත්, සංස්කෘතික වෙනස්කම් සඳහා සූදානම් කිරීමත් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. කුටුම්භ වැඩිදියුණු කිරීම සඳහා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ නියමාකාරයෙන් භාවිත කෙරෙන බව තහවුරු කිරීම පිණිස ප්‍රේෂණ කළමනාකරණය පිළිබඳව එසේ විදේශ රැකියා සඳහා පිටව යන්නන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම ද ඉතා වැදගත් වේ. බිම් මට්ටමේ දී, අඛණ්ඩ අධීක්ෂණ පද්ධතියක් සහ විදේශයන්හි සේවාවල නියුක්තව සිටින පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්ට සහය වීම, විශේෂයෙන්ම, ළමා රැකවරණය සහ අධ්‍යාපනික සහය ලබා දීම වැනි අනිකුත් පියවර ක්‍රියාත්මක කිරීම වඩාත් වැදගත් වේ. අනෙකුත් අදාළ බලධාරීන්ගේ ද සහයෝගය සහිතව, අඛණ්ඩ අධීක්ෂණ වැඩසටහනක් ස්ථාපිත කිරීමට සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා උපදේශන සේවා සැපයීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල මගින් සහය ලබා දිය හැකිය.

වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රවාහ සහ විදෙස්ගත ශ්‍රමිකයින්ගේ සංචරණය පිළිබඳව තත්කාලීන දත්ත ලබා ගැනීමේ අඩු පාඩු පවතින බව පෙනී ගොස් ඇත. එබැවින්, ප්‍රේෂණ හා සම්බන්ධ දත්ත එක් රැස් කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. මේ සම්බන්ධව, බලපත්‍රලාභී බැංකු හරහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත, රටවල් අතර සිදුවන ගනුදෙනු සහ විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පුළුල් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියක් (International Transactions Reporting System - ITRS) ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව නියැලී සිටියි. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හා සම්බන්ධ දත්ත පමණක් නොව අදාළ වෙනත් දත්ත රාශියක් ද ඇතුළත් බැවින් මෙම දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත වැඩිදියුණු කිරීමට මෙන්ම, සංඛ්‍යා දත්ත අතර වන නොගැලපීම් විසඳීම සඳහා ද සහය වනු ඇත. ප්‍රේෂණ ලැබෙන රට, මුදල් වර්ගය, ප්‍රේෂණ ලැබෙන දිස්ත්‍රික්ක, විදේශ සේවා නියුක්තිකයින්ගේ සංයුතිය සහ ප්‍රේෂණ ලැබෙන බැංකුව යන සාධක මත පදනම්ව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පිළිබඳ සවිස්තරාත්මක දත්ත මෙම ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් ලබා ගැනීමට හැකි වන අතර, මෙය, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ව්‍යාප්තිය වඩාත් පැහැදිලිව ඇස්තමේන්තු කිරීමට සහ නැගී එන ප්‍රවණතා හඳුනා ගැනීමටත්, ප්‍රේෂණ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමටත් උපකාරී වනු ඇත.

මෙරට සම්පත් පරතරය පියවීම සඳහා ණය බර ඇති නොකරන මූලාශ්‍රවලින් ලැබෙන විදේශ විනිමය ඉපැයීම් සහ ලැබීම් වැඩිදියුණු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට රජය අපේක්ෂා කරයි. මේ සම්බන්ධයෙන්, ගෙවුම් තුලන හිඟයයන් පියවීම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය වර්ධනය කිරීම, ජාත්‍යන්තර සංචිත වැඩිදියුණු කිරීම හරහා රටේ ණය ගෙවීමේ හැකියාව වර්ධනය කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම සහ ඉතුරුම් හා ආයෝජන ප්‍රවර්ධනය කිරීම යනාදිය සඳහා දායක වෙමින් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ධනාත්මක බලපෑම තවදුරටත් වර්ධනය කිරීම පිණිස, සියලුම පාර්ශවකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයෙන්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ රැකියා සඳහා විදෙස්ගත වීම සම්බන්ධයෙන් අවම පිරිවැයක්, වැඩි ආරක්ෂාවක් සහ වැඩි ඵලදායීත්වයක් ඇති කිරීමට රජය සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අවධානය යොමු කළ යුතු වේ.


මූලාශ්‍ර

1. Maimbo, S.M. and Ratha, D. (Eds.) (2005). *Remittances: Development impact and future prospects.* Washington, DC: World Bank.
2. Ratha, D., De, S., Kim, E., Plaza, S., Seshan, G., and Yameogo, N. (2020). Migration and Development Brief 33: Phase II: COVID -19 Crisis through a Migration Lens. Washington, DC: KNOMAD-World Bank.
3. World Bank. (2019). *Leveraging Economic Migration for Development: A Briefing for the World Bank Board.* Washington, DC: World Bank.
4. World Bank. (2020). Remittance Prices Worldwide. Washington, DC: World Bank.

### 5.2.4 ද්විතීයික ආදායම

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හිතකර ලෙස වර්ධනය වීමත් සමග, 2020 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුම ශක්තිමත් විය.** විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ පළමු මාස දෙක තුළ දී වර්ධනයක් වාර්තා කළ ද, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ රටවල සේවා නියුක්තව සිටි සමහර ශ්‍රමිකයින් නැවත මෙරටට පැමිණීමත්, විදේශයන්හි සේවා නියුක්තව සිටි ඇතැම් සේවකයින්ගේ රැකියා අහිමි වීමත්, රැකියා සඳහා විදේශගත වීම තාවකාලිකව නැවැත්වීමත් සමඟ 2020 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලපරිච්ඡේදයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු විය. කෙසේ වෙතත්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එතැන් සිට අඛණ්ඩව ඉහළ ගිය අතර, 2019 වසරේ දී වාර්තා වූ සියයට 4.3ක අඩු වීමට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 5.8ක වර්ධනයක් වාර්තා කළේය. බොහෝ ජාත්‍යන්තර දේශසීමා වසා තැබීම හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින් එම රටවල් තුළ රැඳී සිටින කාලය දීර්ඝ වීම, මුදල් ප්‍රේෂණය සඳහා විධිමත් මාර්ග භාවිතය ඉහළ යෑම සහ වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ දුෂ්කරතා කළමනාකරණය කරගැනීම සඳහා විදේශ සේවා නියුක්තිකයින් විසින් සිය පවුල් වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ප්‍රමාණය ඉහළ යා හැකි වීම මෙම වර්ධනයට හේතු වූවා විය හැකිය. මේ අතර, වසර තුළ දී ශ්‍රී ලංකාවේ වෙසෙන අනේවාසිකයින් විසින් සිදු කරන ලද පෞද්ගලික සංක්‍රාම සහ ආශ්‍රිත ගෙවීම් ද පහළ ගියේය. මෙම ප්‍රවණතා හමුවේ, 2019 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 5.8ක් වූ ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.2ක් දක්වා ඉහළ ගියේය.

### 5.3 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**2020 වසරේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ලැබීම් සමස්තයක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.** පෙර වසර සමඟ සැසඳීමේ දී 2020 වසරේ දී රජය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම සුළු වශයෙන් ඉහළ ගිය අතර, පෞද්ගලික අංශය වෙත වූ සංක්‍රාම අඩු වීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 23ක අතිරික්තයක් වාර්තා කළ ප්‍රාග්ධන ගිණුම 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 28ක අතිරික්තයක් වාර්තා කළේය.

### 5.4 මූල්‍ය ගිණුම

**2020 වසරේ දී ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමෙහි මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස් වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළේය.** 2020 වසරේ දී මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස් වීම්, 2019 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 2,974ක ශුද්ධ වැඩි වීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,566ක ශුද්ධ අඩු වීමක් වාර්තා කළේය. මේ අතර, 2020 වසරේ දී මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්, 2019 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 514ක ඉහළ යෑමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,825ක අඩු වීමක් වාර්තා කළේය.

**5.11 රූප සටහන**
**මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2019 වසරට සාපේක්ෂව හිමිකම් හා ණය අඩුවෙන් ලැබීමත්, ණය සේවාකරණ ගෙවීම් වැඩි වීමත් හේතුවෙන් 2020 වසරේ මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සැලකිය යුතු ලෙස අඩු විය.** රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ සිදු වූ විදේශීය ආයෝජන හා සම්බන්ධ ශුද්ධ ගෙවීම් ඉහළ යෑම, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් කල් පිරීම, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශීය ආයෝජන ගෙවීම්, විදේශීය සෘජු ආයෝජනවල ලැබීම් අඩු මට්ටමක පැවතීම මෙන්ම, අනේවාසිකයින් විසින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ශුද්ධ පදනම මත ද්විතීයික වෙළඳපොළෙහි විකිණීම යන කරුණු 2020 වසරේ වගකීම් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2020 වසරේ මාර්තු මාසයේ දී චීන සංවර්ධන බැංකුව මගින් සපයන ලද විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම

5

## 5.8.අ. සංඛ්‍යා සටහන
## මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2019 (අ) | | 2020 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **514** | **2,974** | **-1,825** | **-1,566** |
| **සෘජු ආයෝජන** | **77** | **743** | **15** | **434** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 65 | 370 | 10 | 211 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 52 | 110 | 7 | 20 |
| සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 52 | 110 | 7 | 20 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 13 | 260 | 3 | 191 |
| ණය උපකරණ | 13 | 374 | 4 | 223 |
| සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 13 | 374 | 4 | 223 |
| **විවිධ ආයෝජන** | - | **2,313** | - | **-2,383** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | - | -4 | - | -217 |
| ණය සුරැකුම්පත් | - | 2,317 | - | -2,166 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | -250 | - | - |
| දිගු කාලීන | - | -250 | - | - |
| රජය | - | 2,567 | - | -2,166 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | 55 | - | -122 |
| දිගු කාලීන | - | 2,513 | - | -2,044 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | -388 | - | -431 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | 1 | - | 22 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 2,900 | - | -1,635 |
| නිකුතු | | 4,400 | | - |
| කල්පිරීම් | - | -1,500 | - | -859 |
| ද්විතීක වෙළඳපොළ ගනුදෙනු | - | - | - | -776 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **100** | **-82** | **-136** | **383** |
| මුදල් සහ තැන්පතු | -93 | 167 | 64 | -15 |
| මහ බැංකුව | - | ... | - | 400 |
| කෙටි කාලීන | - | ... | - | ... |
| දිගු කාලීන | - | - | - | 400 |
| තැන්පතු භාරගන්නා ආයතන | -93 | 168 | 64 | -415 |
| කෙටි කාලීන | 6 | 168 | 259 | -415 |
| දිගු කාලීන | -99 | - | -194 | - |
| **පිටු අංක 143 හා සම්බන්ධයි** | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **විදේශීය සෘජු ආයෝජන** | | | | |
| හිමිකම් | | 110 | | 20 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | | 260 | | 191 |
| අන්තර් සමාගම් ණය | | 391 | | 223 |
| අන්තර් සමාගම් ණය ආපසු ගෙවීම් | | -17 | | - |
| **මුළු විදේශීය සෘජු ආයෝජන (1)** | | **743** | | **434** |
| ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2) | | 445 | | 236 |
| **ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)** | | **1,189** | | **670** |
| **කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **-35** | | **-225** |
| සෘජු ආයෝජන | | -31 | | -9 |
| විවිධ ආයෝජන | | -4 | | -217 |
| **රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)** | | **-334** | | **-553** |
| විදේශීය මිල දී ගැනීම් | | 596 | | 120 |
| විදේශීය විකුණුම් | | 930 | | 673 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තු සමඟ සසඳන විට යම් වෙනසක් වේ නම් එසේ වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහ ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුව 2020 වසරේ ජූලි මාසයේ දී සැපයූ විදේශ විනිමය හුවමාරු පහසුකම මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් විය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සඳහා වූ ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන 2019 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,189ට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 670කට සීමා විය. 2020 වසරේ දී ගෝලීය වශයෙන් විදේශීය සෘජු ආයෝජන සැලකිය යුතු අඩු වීමක් වාර්තා කිරීමට හේතු වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය මගින් ගෝලීය මූල්‍ය වෙළඳපොළ තුළ ඇති කරන ලද අවිනිශ්චිතතා විදේශීය සෘජු ආයෝජන අඩු වීමට මූලික වශයෙන් බලපෑවේය. සෘජු ආයෝජන ව්‍යාපාර ලබා ගත් ණය ඇතුළත් නොවූ විදේශීය සෘජු ආයෝජන ද, 2020 වසරේ දී අඩු වී ඇත. 2020 වසරේ දී විදේශීය සෘජු ආයෝජන මූලික වශයෙන් අන්තර් සමාගම් ණය ගැනීම් හා දැනට පවතින විදේශීය සෘජු ආයෝජන සමාගම් මගින් ප්‍රතිආයෝජිත ඉපැයීම් ස්වරූපයෙන් වූ අතර, වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ආයෝජන තීරණ හා සම්බන්ධ අවිනිශ්චිතතා සහ විදේශීය ආයෝජකයින් හට පොදුවේ බලපෑ විදේශ ගමන් පිළිබඳ සීමා හේතුවෙන් නව සමාගම් වෙත වූ විදේශීය සෘජු ආයෝජන නොසැලකිය යුතු තරම් මට්ටමක පැවතුණි. අංශ අනුව සැලකීමේ දී, දේපළ සංවර්ධනය, විදුලි සන්දේශ, ඇඟලුම් හා හෝටල් ක්ෂේත්‍ර සම්බන්ධ ව්‍යාපෘති විදේශීය සෘජු ආයෝජන ලැබුණු ප්‍රධාන අංශ විය. 2020 වසරේ විදේශීය සෘජු ආයෝජන අඩු වුවද, කොළඹ වරාය නගරයෙහි නීතිමය රාමුව අවසන් කිරීමත්, විදේශීය ආයෝජකයින් විසින් මෑතක දී දක්වන ලද උනන්දුවත් සමඟ, විශේෂයෙන්ම කොළඹ වරාය නගරය සහ හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා නුදුරේදී ම විදේශීය සෘජු ආයෝජන ලැබෙනු ඇතැයි රජය අපේක්ෂා කරයි. 2019 වසරේ එ.ජ. ඩොලර් මිලියන 4ක් වූ ශුද්ධ ගෙවීම්වලට සාපේක්ෂව සෘජු ආයෝජන ගනුදෙනු හැර කොළඹ කොටස් වෙළඳපොළෙහි අනේවාසිකයින්ගේ ආයෝජන ඇතුළත් හිමිකම් කොටස් මත වූ විවිධ ආයෝජන 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 217ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එ.ජ. ඩොලර් මිලියන 217ක ශුද්ධ ගෙවීම, එ.ජ. ඩොලර් මිලියන 276ක ද්විතීයික වෙළඳපොළෙහි ශුද්ධ ගෙවීම්වලින් හා එ.ජ. ඩොලර් මිලියන 59ක ප්‍රාථමික වෙළඳපොළෙහි ලැබීම්වලින් සමන්විත විය. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් කල් පිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද නව සමීක්ෂණයකට අනුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට සම්බන්ධව

### 5.8.ආ සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2019 (අ) | | 2020 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 142 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | -245 | - | 327 |
| මහ බැංකුව | - | 327 | - | -14 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 327 | - | -14 |
| විස්තීර්ණ ණය පහසුකම | - | 327 | - | -14 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | -281 | - | 75 |
| කෙටි කාලීන | - | -1 | - | 403 |
| දිගු කාලීන | - | -280 | - | -328 |
| රජය | - | -89 | - | 169 |
| දිගු කාලීන | - | -89 | - | 169 |
| අනෙකුත් අංශ (ඇ) | - | -203 | - | 96 |
| දිගු කාලීන | - | -203 | - | 96 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -4 | -28 | -224 | 185 |
| තැන්පතු භාරගන්නා ආයතන | -8 | - | 9 | - |
| කෙටි කාලීන | -8 | - | 9 | - |
| අනෙකුත් අංශ (ඈ) | 4 | -28 | -233 | 185 |
| කෙටි කාලීන | 4 | -28 | -233 | 185 |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | 196 | 24 | 24 | -114 |
| මහ බැංකුව | - | 24 | - | -114 |
| කෙටි කාලීන (ඉ) | - | 24 | - | -114 |
| තැන්පතු භාරගන්නා ආයතන | 196 | - | 24 | - |
| කෙටි කාලීන | 196 | - | 24 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **337** | | **-1,704** | |
| මූල්‍ය රත්‍රන් | -14 | | -667 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 6 | | -5 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 346 | | -1,032 | |
| මුදල් සහ තැන්පතු | 361 | | -177 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | -174 | | -1,092 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 535 | | 914 | |
| සුරැකුම්පත් | -19 | | -856 | |
| ණය සුරැකුම්පත් | -19 | | -856 | |
| දිගු කාලීන | -19 | | -856 | |
| අනෙකුත් හිමිකම් | 3 | | 1 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,460** | | **-260** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **-89** | | **169** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 1,573 | | 1,882 |
| ව්‍යාපෘති ණය | | 1,573 | | 1,382 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | | - | | 500 |
| ගෙවීම් | | 1,662 | | 1,713 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.

(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.

(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රැස් කර ගත් දත්ත මගින් දැක්වූ පරිදි අනේවාසිකයින් විසින් නේවාසිකයින් වෙත ද්විතීයික වෙළඳපොළ තුළ සිදු කරන ලද ශුද්ධ විකුණුම් සමඟ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආකාරයෙන් පවතින විවිධ ආයෝජන 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,635ක සැලකිය යුතු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ගෝලීය ප්‍රාග්ධන ප්‍රවාහයන්හි ප්‍රවණතා වෙනස්වීම හේතුවෙන් වසර තුළ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 553ක සැලකිය යුතු ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මේ අතර, තැන්පතු භාර ගන්නා ආයතනයන්හි මුදල් හා තැන්පතු වගකීම් අඩු විය. කෙසේ වෙතත්, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී කල් පිරුණු, 2020 වසරේ ජූලි මාසයේ දී ලද ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානයේ එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම හා සම්බන්ධ ලැබීම් හේතුවෙන් මහ බැංකුවේ මුදල් හා තැන්පතු වගකීම් ඉහළ ගියේය. 2020 වසර තුළ දී තැන්පතු භාර ගන්නා ආයතන ලබා ගත් ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ ගියේය. තවද, 2020 වසරේ මාර්තු මාසයේ දී චීන සංවර්ධන බැංකුවෙන් එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම ලැබීමත් සමඟ රජයට ශුද්ධ විදේශීය ණය ලැබීම් වාර්තා විය. සියලු ආකාරයේ රජයේ විදේශීය වගකීම්, එනම් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර, වසර තුළ දී ශුද්ධ ගෙවීම් වාර්තා කිරීම මගින් විදේශීය මූල්‍යකරණය සම්බන්ධයෙන් රජය මුහුණ දී ඇති බාධාවන් පෙන්නුම් කරයි. වෙළඳ ණය සහ අත්තිකාරම් ආකාරයෙන් වූ වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2020 වසරේ දී ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 2020 වසරේ දී අඩුවීමක් වාර්තා කළේය.

**මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2020 වසරේ දී අඩු වූ අතර, දළ නිල සංචිත අඩු වීම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය.** මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2019 වසරේ එ.ජ. ඩොලර් මිලියන 514කින් ඉහළ යෑමට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,825කින් අඩු විය. මූල්‍ය වත්කම් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජය වෙත විදේශීය මූල්‍ය ප්‍රවාහ අඩු වීම මධ්‍යයේ රජය වෙනුවෙන් සිදු කරන ලද ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හමුවේ 2020 වසරේ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් මිලියන 1,704කින් සැලකිය යුතු ලෙස අඩු වීමයි. වසර තුළ

5

### 5.9 සංඛ්‍යා සටහන
### 2020 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතින් මුළු එකතුව** | **1,382** |
| එයින්; | |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **305** |
| එයින්; | |
| දෙවන ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 1 වන වාරිකය හා 2 වන වාරිකය | 68 |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **266** |
| එයින්; | |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 149 |
| හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය (දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම - 3 කොටස) | 40 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **253** |
| එයින්; | |
| කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය | 72 |
| සමාජ ආරක්ෂණ පද්ධති ව්‍යාපෘතිය | 50 |
| කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 19 |
| **ජපානය** | **161** |
| එයින්; | |
| කැළණි ගඟ හරහා නව පාලමක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 72 |
| මහනුවර නගරයේ අපජලය කළමණාකරණ ව්‍යාපෘතිය | 24 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය | 15 |
| **එච්. එස්. බී. සී. (හොංකොං)** | **89** |
| ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උඩරට මාර්ගයේ මෙහෙයුම් සඳහා ඩීසල් බහුවිධ ඒකක ප්‍රසම්පාදනය කිරීම | 59 |
| තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් නගාසිටුවීම | 30 |
| **කැල්යෝන් ක්‍රෙඩිට් ඇග්රිකෝල් (Calyon Credit Agricole)** | **74** |
| මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය | 43 |
| කැළණි දකුණ ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2 වන අදියර | 31 |
| **ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව** | **70** |
| එයින්; | |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපාතිය | 32 |
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 24 |
| **ඉන්දියාව** | **39** |
| එයින්; | |
| උතුරු දුම්රිය සේවා ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය | 38 |
| **ඉන්දියානු අපනයන - ආනයන බැංකුව** | **17** |
| දුම්රිය අංශය සංවර්ධනය සඳහා වූ ණය | 17 |

මූලය: මුදල් අමාත්‍යාංශය

සංචිත ආශ්‍රිත ගනුදෙනුවල විශේෂ ලක්ෂණයක් වූයේ මහ බැංකුව විසින් උපායමාර්ගිකව මූල්‍ය රත්‍රන් වත්කම් සැලකිය යුතු ලෙස අඩු කිරීමයි. 2020 වසරේ දී බැංකු අංශයේ ද මුදල් හා තැන්පතු වත්කම් වැඩි වීමක් වාර්තා විය. මේ අතර, ශ්‍රී ලංකා අපනයනකරුවන් ඔවුන්ගේ විදේශීය වෙළඳ හවුල්කරුවන්ට ලබා දී ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් මගින් පිළිබිඹු කරන වෙළඳ ණය සහ අත්තිකාරම් හා සම්බන්ධ වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් ද වසර තුළ අඩු වීමක් වාර්තා කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ලැබිය යුතු අනෙකුත් ගිණුම්, වසර තුළ සුළු ශුද්ධ වර්ධනයක් වාර්තා කළේය.

## 5.5 සමස්ත ශේෂය

**ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනසට සමාන වන සමස්ත ශේෂය, 2019 වසරේ දී වාර්තා කළ අතිරික්තයට සාපේක්ෂව 2020 වසරේ දී හිඟයක් වාර්තා කළේය.** වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම සහ ඉහළ ප්‍රමාණයක විදේශීය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු විය. 2020 වසරේ දී, ශුද්ධ ජාත්‍යන්තර සංචිත ද සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 වසරේ සමස්ත ශේෂය එ.ජ. ඩොලර් මිලියන 2,328ක හිඟයක් වාර්තා කළේය.

## 5.6 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**අනේවාසිකයින් සමඟ සිදු කෙරුණු ගනුදෙනුවලට අදාල ඇති මුළු විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වයන් අතර වෙනස, එනම්, ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, 2020 වසරේ දී යහපත් විය.** ඒ අනුව, 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 51.2ක ශුද්ධ වගකීම් තත්ත්වයක සිට 2020 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 47.9ක ශුද්ධ වගකීම් තත්ත්වයක් දක්වා අන්තර්ජාතික ආයෝජන තත්ත්වය යහපත් මට්ටමකට පත් විය. මෙය, රටෙහි විදේශීය වත්කම් තත්ත්වය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 13.0ක සිට 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.9ක් දක්වා අඩු වූ වාතාවරණ තුළ 2019 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 64.1ක් වූ රටේ විදේශීය වගකීම් තත්ත්වය 2020 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 58.8ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වීමේ ප්‍රතිඵලයක් විය.

**ශ්‍රී ලංකාව විසින් අනේවාසිකයින් සමඟ සිදු කළ ගනුදෙනු හා සම්බන්ධ විදේශීය වත්කම් තත්ත්වය 2020 වසරේ දී සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය.** 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.6ක් වූ දළ නිල සංචිත ප්‍රමාණය 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් දක්වා අඩු වීම විදේශීය වත්කම් තත්ත්වය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.[1]

[1] විදේශීය සංචිත තත්ත්වයෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් 5.6.1. කොටසෙහි අන්තර්ගත වේ.

### 5.10 සංඛ්‍යා සටහන
### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| ශීර්ෂය | 2019 (අ) | | 2020 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **1,497** | **13,065** | **1,509** | **13,832** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,466 | 8,287 | 1,473 | 8,831 |
| ණය උපකරණ | 31 | 4,778 | 36 | 5,001 |
| **විවිධ ආයෝජන** | **...** | **15,855** | **...** | **8,420** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 1,049 | | 708 |
| අනෙකුත් අංශ | | 1,049 | | 708 |
| ණය සුරැකුම්පත් (ඈ) | ... | 14,806 | ... | 7,712 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | | ... | |
| කෙටි කාලීන | ... | | ... | |
| රජය | | 14,632 | | 7,616 |
| කෙටි කාලීන | | 119 | | 4 |
| දිගු කාලීන | | 14,513 | | 7,613 |
| අනෙකුත් අංශ | | 174 | | 96 |
| දිගු කාලීන | | 174 | | 96 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **3,846** | **35,227** | **3,710** | **36,499** |
| **මුදල් සහ තැන්පතු** | **771** | **1,748** | **835** | **1,734** |
| මහ බැංකුව | | ... | | 400 |
| කෙටි කාලීන | | ... | | ... |
| දිගු කාලීන | | - | | 400 |
| තැන්පතු භාරගන්නා ආයතන | 771 | 1,748 | 835 | 1,333 |
| කෙටි කාලීන | 363 | 1,748 | 622 | 1,333 |
| දිගු කාලීන | 408 | | 214 | |
| **ණය** | | **30,320** | | **31,512** |
| මහ බැංකුව | | 1,315 | | 1,378 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | | 1,315 | | 1,378 |
| තැන්පතු භාරගන්නා ආයතන | | 5,249 | | 5,324 |
| කෙටි කාලීන | | 3,771 | | 4,174 |
| දිගු කාලීන | | 1,478 | | 1,150 |
| රජය | | 19,617 | | 20,570 |
| දිගු කාලීන | | 19,617 | | 20,570 |
| අනෙකුත් අංශ (ඉ) | | 4,139 | | 4,240 |
| දිගු කාලීන | | 4,139 | | 4,240 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **1,178** | **2,156** | **954** | **2,341** |
| තැන්පතු භාරගන්නා ආයතන | 92 | | 101 | |
| කෙටි කාලීන | 92 | | 101 | |
| අනෙකුත් අංශ (ඊ) | 1,086 | 2,156 | 853 | 2,341 |
| කෙටි කාලීන | 1,086 | 2,156 | 853 | 2,341 |
| **අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්** | **1,896** | **456** | **1,920** | **343** |
| මහ බැංකුව (උ) | | 456 | | 343 |
| කෙටි කාලීන | | 456 | | 343 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,896 | | 1,920 | |
| කෙටි කාලීන | 1,896 | | 1,920 | |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **547** | | **570** |
| **සංචිත වත්කම්** | **7,642** | | **5,664** | |
| මූල්‍ය රත්‍රන් | 955 | | 409 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 7 | | 3 | |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 66 | | 69 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,614 | | 5,184 | |
| මුදල් සහ තැන්පතු | 2,387 | | 2,210 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 1,952 | | 861 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 435 | | 1,350 | |
| සුරැකුම්පත් | 4,227 | | 2,974 | |
| ණය සුරැකුම්පත් | 4,227 | | 2,974 | |
| **මුළු වත්කම්/වගකීම්** | **12,985** | **64,148** | **10,883** | **58,750** |
| **ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය** | | **-51,162** | | **-47,868** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 12,985 | 64,148 | 10,883 | 58,750 |
| කෙටි කාලීන | 6,846 | 9,299 | 6,184 | 8,902 |
| දිගු කාලීන | 6,139 | 54,849 | 4,699 | 49,848 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය නිකුතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු ජාත්‍යන්තර සංචිත ද, ප්‍රධාන වශයෙන් දළ නිල සංචිත අඩු වීම හේතුවෙන් 2020 වසරේ දී අඩු වූ අතර, වාණිජ බැංකු සතු විදේශීය වත්කම්වල සුළු වර්ධනයක් වාර්තා විය. මේ අතර, ශ්‍රී ලාංකික නේවාසිකයින් විසින් විදේශයන්හි සිදු කරනු ලබන ආයෝජන පිළිඹිබු කෙරෙන සෘජු ආයෝජන වත්කම් තත්ත්වය වසර තුළ සුළු වශයෙන් ඉහළ ගියේය. තැන්පතු භාරගන්නා ආයතන සතු මුදල් හා තැන්පතු සහ ලැබිය යුතු අනෙකුත් ගිණුම් ද 2020 වසරේ දී ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී බැංකු අංශයේ විදේශීය වත්කම්වල වැඩි වීමක් වාර්තා විය. මේ අතර, 2020 වසර අවසානයේ දී අනේවාසිකයින්ට ලබා දී ඇති වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති වත්කම් තත්ත්වය මගින් පිළිඹිබු වන තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශය විසින් අනේවාසිකයින්ට ලබා දී ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් තත්ත්වය 2019 වසර අවසානයේ දී පැවති තත්ත්වයට වඩා අඩු විය.

**ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල තක්සේරු මිල අඩු වීම සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් කොටසක් නේවාසිකයින් විසින් දරනු ලබන බැඳුම්කර ලෙස නැවත වර්ගීකරණය කිරීම හේතුවෙන් අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙන් පිළිඹිබු වූ ශ්‍රී ලංකාවේ මුළු විදේශීය වගකීම් තත්ත්වය 2020 වසර අවසන් වන විට සැලකිය යුතු ලෙස අඩු විය.** මුළු වගකීම් තත්ත්වය 2019 වසර අවසානයේ එ.ජ. ඩොලර් බිලියන 64.1 හා සසඳන විට 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 58.8ක් දක්වා අඩු විය. කොවිඩ්-19 වසංගතය සහ ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම මගින් තීව්‍ර වූ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළවල අවිනිශ්චිතතාවයන්ගේ බලපෑම හේතුවෙන් ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාත ඉහළ යෑම හා සමගාමීව රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල පහත වැටීම මත විවිධ ආයෝජන වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස අඩු වීම, මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව බැඳුම්කරවල නේවාසික ආයතන සතු නොපියවා ඉතිරිව ඇති ආයෝජන පිළිබඳව මහ බැංකුව විසින් සිදු කරන ලද නව සමීක්ෂණයකට අනුව, 2019 සහ 2020 වසර අවසානයේ දී රටෙහි ස්වෛරීත්ව බැඳුම්කර මත වූ ආයෝජනවලින් කොටසක් දේශීය වගකීම් ලෙස නැවත වර්ගීකරණය කිරීම ද 2020 වසර අවසානයේ විවිධ ආයෝජන වගකීම් තත්ත්වය සහ 2019 වසර

අවසානයේ සංශෝධිත වගකීම් තත්ත්වය අඩු වීමට දායක විය. මීට අමතරව, රුපියල්වලින් නාමනය කර ඇති රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙන් මෙන්ම කොළඹ කොටස් වෙළෙඳපොළෙන් වාර්තා වූ විදේශීය ආයෝජන ගෙවීම් ද විවිධ ආයෝජන වගකීම් තත්ත්වය අඩු වීමට දායක විය. මෙම ප්‍රවණතා හේතුවෙන් විවිධ ආයෝජන වගකීම් තත්ත්වය 2019 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 15.9 හා සසඳන විට 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 8.4ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, වසර තුළ දී ශුද්ධ සෘජු ආයෝජන ලැබීම් හේතුවෙන් 2020 වසර අවසානය වන විට සෘජු ආයෝජන වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් බිලියන 13.8ක් දක්වා ඉහළ ගියේය. තවද, සෘජු ආයෝජකයින් විසින් ලබා දී ඇති ණය සහ අත්තිකාරම්වල වැඩිවීම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්ගේ ණය උපකරණ හා සම්බන්ධ වගකීම් තත්ත්වය ඉහළ ගියේය. රජය, මහ බැංකුව, තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශයේ සමාගම් හා රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් සමන්විත අනෙකුත් අංශවල විදේශීය ණය වගකීම්වල සුළු වැඩිවීම හේතුවෙන් අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය 2020 වසර අවසානය වන විට ඉහළ ගියේය. ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයෙහි විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් සමග මහ බැංකුවේ මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය 2020 වසර අවසානය වන විට ඉහළ ගියද, අනේවාසිකයින්ගේ තැන්පතු වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය සුළු වශයෙන් අඩු වීම නිසා මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය පහළ ගියේය. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබුණු වෙළෙඳ ණය අඩු වුවද, ශ්‍රී ලාංකික ආනයනකරුවන් වෙත ලැබුණු වෙළෙඳ ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය ඉහළ ගිය අතර, 2020 වසරේ දී මහ බැංකුවේ ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ වගකීම් අඩු වීමත් සමග ගෙවිය යුතු අනෙකුත් ගිණුම්වල තත්ත්වය අඩු විය.

## 5.6.1 සංචිත වත්කම් තත්ත්වය

විදේශ විනිමය ලැබීම් අඩු වීම මධ්‍යයේ සැලකිය යුතු ප්‍රමාණයක රජයේ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් දළ නිල සංචිත 2019 වසර අවසානය වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 7.6 හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් දක්වා අඩු විය. කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයට අදළ එ.ජ. ඩොලර් බිලියනයක ආපසු ගෙවීම, විදේශීය ව්‍යාපෘති ණය

### 5.11 සංඛ්‍යා සටහන
### දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| ශීර්ෂය | 2016 | 2017 | 2018 | 2019 | 2020 (අ) |
|---|---|---|---|---|---|
| 1. රජයේ විදේශීය වත්කම් | 289 | 488 | 817 | 386 | 155 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 5,730 | 7,470 | 6,102 | 7,256 | 5,510 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 6,019 | 7,959 | 6,919 | 7,642 | 5,664 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 2,414 | 2,478 | 2,664 | 2,760 | 2,856 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 8,433 | 10,436 | 9,583 | 10,402 | 8,521 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 1,490 | 1,361 | 1,425 | 1,771 | 2,121 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 4,529 | 6,597 | 5,495 | 5,871 | 3,543 |
| 8. සමස්ත ශේෂය (ඈ) | -500 | 2,068 | -1,103 | 377 | -2,328 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 9.1 වෙළෙඳ භාණ්ඩ | 3.8 | 4.6 | 3.7 | 4.6 | 4.2 |
| 9.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 3.1 | 3.8 | 3.1 | 3.7 | 3.7 |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 10.1 වෙළෙඳ භාණ්ඩ | 5.3 | 6.0 | 5.2 | 6.3 | 6.4 |
| 10.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 4.3 | 4.9 | 4.3 | 5.1 | 5.6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළෙඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම

වාරික ආපසු ගෙවීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම සම්බන්ධ ආපසු ගෙවීම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා අක්වෙරළ බැංකු ඒකක ආශ්‍රිත ණය

### 5.12 රූප සටහන
### කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් ඇතුළත් විදේශීය විනිමය ණය සේවාකරණ ගෙවීම්, වසර තුළ දී දළ නිල සංචිත අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී දළ නිල සංචිත නැවත ගොඩ නැංවීම සඳහා මූලික වූයේ එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, එ.ජ. ඩොලර් මිලියන 720ක අක්වෙරළ බැංකු ඒකක ආශ්‍රිත ණය සහ එ.ජ. ඩොලර් මිලියන 400ක ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයෙහි විදේශ විනිමය හුවමාරු ගිවිසුම මගින් වූ ලැබීම් ය. ඒ අනුව, වසර අවසානයේ පැවති දළ නිල සංචිත මට්ටම ආනයන මාස 4.2කට සමාන වූ අතර, ඉදිරි වසර තුළ කල්පිරීමට නියමිත කෙටිකාලීන ණය සහ වගකීම්වලින් සියයට 43ක් විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු ජාත්‍යන්තර සංචිත ද 2020 වසර අවසානය වන විට අඩු වූ අතර, වාණිජ බැංකු සතු විදේශීය වත්කම්වල සුළු වශයෙන් වැඩි වීමක් වාර්තා වුව ද, දළ නිල සංචිත ප්‍රමාණය අඩු වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුළු විදේශීය වත්කම් තත්ත්වය 2020 වසර අවසානය වන විට ආනයනික මාස 6.4කට සමාන විය.

## 5.7 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.7.1 විදේශීය ණය

2020 වසරේ දී ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු විය. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු වීම, 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු ගෙවීම, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් කොටසක් දේශීය වගකීම් ලෙස නැවත වර්ගීකරණය කිරීම සහ අනේවාසිකයින් සතු රුපියල්වලින් නාමනය නරන ලද රාජ්‍ය සුරැකුම්පත් ප්‍රමාණය අඩු වීම හේතුවෙන් ගනුදෙනු කළ හැකි ණය උපකරණවල වෙළඳපොළ වටිනාකම මත පදනම්ව ගණනය කළ විට රටෙහි විදේශීය ණය තත්ත්වය 2019 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 54.8ක සිට 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 49.2ක් දක්වා අඩු විය. 2020 වසරේ මැයි මාසයේ දී අවසාන වාරිකය වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 333ක් ආපසු ගෙවීමත් සමඟ 2017 වසරේ දී ලබාගත් එ.ජ. ඩොලර් බිලියනයක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම

**5.12 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| **රජය** | **34,249** | **28,187** |
| **කෙටි කාලීන** | **119** | **4** |
| ණය සුරැකුම්පත් | 119 | 4 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 119 | 4 |
| **දිගු කාලීන** | **34,130** | **28,183** |
| ණය සුරැකුම්පත් | 14,513 | 7,613 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 406 | 31 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 5 | 27 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 14,102 | 7,555 |
| ණය | 19,617 | 20,570 |
| **මහ බැංකුව** | **2,318** | **2,690** |
| **කෙටි කාලීන** | **456** | **343** |
| මුදල් සහ තැන්පතු | ... | ... |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 456 | 343 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 456 | 343 |
| **දිගු කාලීන** | **1,862** | **2,348** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 547 | 570 |
| මුදල් සහ තැන්පතු | - | 400 |
| ණය | 1,315 | 1,378 |
| ජා.මූ. අරමුදලේ ණය | 1,315 | 1,378 |
| විස්තීර්ණ ණය පහසුකම | 1,315 | 1,378 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **6,997** | **6,657** |
| **කෙටි කාලීන** | **5,519** | **5,507** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 1,748 | 1,333 |
| වාණිජ බැංකු | 1,748 | 1,333 |
| ණය | 3,771 | 4,174 |
| වාණිජ බැංකු | 3,771 | 4,174 |
| **දිගු කාලීන** | **1,478** | **1,150** |
| ණය | 1,478 | 1,150 |
| වාණිජ බැංකු | 1,412 | 1,109 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 66 | 41 |
| **අනෙකුත් අංශ (උ)** | **6,469** | **6,676** |
| **කෙටි කාලීන** | **2,156** | **2,341** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 2,156 | 2,341 |
| **දිගු කාලීන** | **4,313** | **4,335** |
| ණය සුරැකුම්පත් (ඉ) | 174 | 96 |
| ණය | 4,139 | 4,240 |
| පෞද්ගලික අංශය | 2,235 | 2,458 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 1,904 | 1,781 |
| **සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ)** | **4,778** | **5,001** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **54,811** | **49,212** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන්** | | |
| දළ විදේශීය ණය | 65.3 | 60.9 |
| කෙටි කාලීන ණය | 9.8 | 10.1 |
| දිගු කාලීන ණය | 55.5 | 50.8 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | | |
| කෙටි කාලීන ණය | 15.1 | 16.7 |
| දිගු කාලීන ණය | 84.9 | 83.3 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **අනේවාසිකයින් සතු ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම-ආංශික වර්ගීකරණය** | **14,690** | **12,058** |
| රජය | 14,515 | 11,883 |
| භාණ්ඩාගාර බිල්පත් | 131 | 4 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 442 | 33 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 5 | 27 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 13,937 | 11,820 |
| අනෙකුත් අංශ | 175 | 175 |
| **නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල මුහුණත වටිනාකම** | **15,050** | **14,050** |
| අනේවාසිකයින් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය | 13,937 | 11,820 |
| නේවාසිකයින් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (2019 වසරේ දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල අන්තර්ගත නොවේ) | 1,113 | 2,230 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරේ දී සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන ලදී. මෙම ප්‍රවණතා සමග, රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 34.2ක සිට 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 28.2ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, මෙම ගණනය කිරීම සඳහා සලකා බැලෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ අගයෙහි පහත වැටීමක් සිදු වුවද, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත වූ සැබෑ වගකීම මුහුණත අගය මත පදනම් ව ඉහළ මට්ටමක පවතී. මේ අතර, ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ විදේශ විනිමය හුවමාරු ගිවිසුම යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබා ගත් එ.ජ. ඩොලර් මිලියන 400 සමඟ මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානය සමඟ සැසඳීමේදී 2020 වසර අවසානය වන විට ඉහළ ගියේය. බැංකු විසින් ලබා ගත් කෙටිකාලීන විදේශීය ණය වැඩි වුවද, මුදල් හා තැන්පතු සහ දිගුකාලීන විදේශීය ණය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් බැංකු අංශයේ විදේශීය ණය 2019 වසර අවසානය සමඟ සසඳන විට 2020 වසර අවසානය වන විට අඩු විය. රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණයවල සුළු අඩු වීම හමුවේ වුවද, පෞද්ගලික අංශය වෙත ලැබුණු විදේශීය ණය සහ නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය වැඩි වීමත් සමඟ 2020 වසරේ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ද ඉහළ ගියේය. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් නිකුත් කරන ලදුව නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර බැඳුම්කරයක වෙළඳපොළ මිල සැලකිය යුතු ලෙස මෙම කාලපරිච්ඡේදය තුළ දී අඩු වීම, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම අඩු වීම සඳහා දායකත්වය සැපයීය. තවද, වසර තුළ දී ඍජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ලැබීමත් සමඟ, ඍජු ආයෝජන ව්‍යාපාරවල අන්තර් සමාගම් ණය 2020 වසරේ දී ඉහළ ගියේය.

**ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රටෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය 2020 වසර තුළ දී කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය.** 2020 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසර අවසානයෙහි පැවැති සියයට 65.3ට සාපේක්ෂව සියයට 60.9ක් වූ අතර, ද.දේ.නි.යෙහි අඩු වීමට සාපේක්ෂව ගනුදෙනු කළ හැකි ණය උපකරණවල වෙළඳපොළ

**5.13 රූප සටහන**
**විදේශීය ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මිල මගින් පිළිබිඹු කරනු ලබන නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහළ යෑම මේ සඳහා හේතු විය. දිගු කාලීන කල් පිරීම් සහ කෙටි කාලීන කල් පිරීම් ඇතුළත් මුළු විදේශීය ණය ප්‍රමාණය, නාමික අගයන්ගෙන් දැක්වීමේ දී, 2020 වසරේ දී පහළ යෑමක් පෙන්නුම් කළේය. මෙම ප්‍රවණතා හා අනුරූපීව, රටෙහි සමස්ත විදේශීය ණය ප්‍රමාණයෙන් විශාලතම කොටස වන රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය 2019 වසර අවසානයේ දී පැවති සියයට 62.5ට සාපේක්ෂව 2020 වසර අවසානයේ දී සියයට 57.3ක් දක්වා පහළ ගියේය. විදේශීය ණය හා සම්බන්ධ නාමික අගයයන් සහ අනුපාත පහළ ගිය ද, ශ්‍රී ලංකාවේ විදේශීය ණය, විශේෂයෙන්ම රජයේ ණය, සමාන ආර්ථික මට්ටමේ රටවලට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. මෙකී අභියෝගාත්මක තත්ත්වය වටහා ගත් රජය, විදේශීය මූල්‍යකරණ මත රටේ ආර්ථිකයේ රඳා පැවතීම අවම කිරීමට පියවර කිහිපයක් ගෙන ඇති අතර, නොපියවා ඉතිරිව ඇති ණය සේවාකරණය අඛණ්ඩව සිදු කරන අතරතුර, ණය නොවන විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීමට උත්සාහ දරයි.

### 5.7.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**ණය වාරික ගෙවීම අඩු වීම සහ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් සුළු වශයෙන් පහළ යෑමත් සමඟ පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පහළ මට්ටමක පැවතුණි.** විදේශීය ණය වාරික ගෙවීම 2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,096ට සාපේක්ෂව, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,851ක් දක්වා අඩු වූ

5

### 5.13 සංඛ්‍යා සටහන
### විදේශීය ණය සේවාකරණ ගෙවීම්

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **5,757** | **4,382** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **4,096** | **2,851** |
| රජය | 3,176 | 2,577 |
| ව්‍යාපෘති ණය | 1,662 | 1,713 |
| ණය සුරැකුම්පත් | 1,514 | 864 |
| මහ බැංකුව | - | 14 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | - | 14 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 903 | 260 |
| විදේශීය ණය | 653 | 260 |
| ණය සුරැකුම්පත් | 250 | - |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 17 | - |
| **1.2 පොලී ගෙවීම්** | **1,661** | **1,530** |
| රජය | 1,389 | 1,397 |
| ව්‍යාපෘති ණය | 430 | 483 |
| ණය සුරැකුම්පත් | 959 | 914 |
| මහ බැංකුව | 37 | 19 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 28 | 18 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | 9 | 2 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 224 | 114 |
| විදේශීය ණය | 207 | 114 |
| ණය සුරැකුම්පත් | 18 | - |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 11 | - |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **19,414** | **13,083** |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **26,392** | **20,398** |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | |
| සමස්ත අනුපාතිකය | 29.7 | 33.5 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 29.5 | 33.2 |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | |
| සමස්ත අනුපාතිකය | 21.8 | 21.5 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 21.7 | 21.3 |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 4,565 | 3,974 |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 79.3 | 90.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2019 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.5ක අගයකින් යුතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විත්වයක් නැවත ගෙවීම හා සැසඳීමේ දී 2020 වසර තුළ දී කල් පිරුණු, එ.ජ. ඩොලර් මිලියන 859ක් අනේවාසිකයින් සතු වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් පමණක් නැවත ගෙවීමයි. ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත දේශීය වාණිජ බැංකුවල ආයෝජනය පිළිබඳව මහ බැංකුව විසින් මෑතක දී සිදු කරනු ලැබූ සමීක්ෂණයකින් හෙළි වූ කරුණක් වූයේ මින් පෙර ආපසු ගෙවන ලද බොහොමයක් ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරුණු අවස්ථාව වන විට ඒ මත දේශිය වාණිජ බැංකුවල ආයෝජන සැලකිය යුතු මට්ටමක පැවති බවයි. ඒ අනුව, 2020 වසරේ පියවන ලද එ.ජ. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය කල් පිරීමේ දී එ.ජ. ඩොලර් මිලියන 859ක් අනේවාසිකයින්ට ද ඉතිරිය නේවාසිකයින්ට ද ගෙවා ඇත. කෙසේ වුව ද, සංසන්දනය කිරීම පිණිස පසුගිය වසර සඳහා අදාළ තොරතුරු සපයා ගත නොහැක. තවද, මෙම වසර තුළ රජයේ විදේශිය ණය වාරික ගෙවීම් ඉහළ ගිය අතර, එ.ජ. ඩොලර් මිලියන 1,380ක වටිනාකමකින් යුතු විදේශීය ව්‍යාපෘති ණය නැවත ගෙවීම සහ එ.ජ. ඩොලර් මිලියන 333ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් යටතේ වන ණය පහසුකමක අවසාන වාරිකය ගෙවීම ද එහි ඇතුළත් විය. මේ අතර, 2019 වසරට සාපේක්ෂව, පෞද්ගලික අංශය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වාරික ගෙවීම් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැගුණු මූල්‍ය ගැටළු හේතුවෙන් පෞද්ගලික සංස්ථා වෙත තම නොපියවූ ණය ගෙවීම සඳහා ලබා දුන් කාලය දීර්ඝ කිරීම මේ සඳහා මූලිකවම හේතු වූවා විය හැකිය. 2020 වසරේ දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් 2016-2019 කාලපරිච්ඡේදය තුළ දී විස්තීර්ණ ණය පහසුකම යටතේ ලබා ගත් ණය මුදලේ පළමුවන වාරිකය වන එ.ජ. ඩොලර් මිලියන 14ක් මහ බැංකුව විසින් පියවන ලදී. මේ අතර, විදේශීය ණය මත වූ පොලී ගෙවීම 2019 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,661 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,530 දක්වා අඩු විය. තවද, නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කූපන ගෙවීම් සහ රජයේ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් වසර තුළ සුළු වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වුව ද, අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය අඩු වීම හේතුවෙන් වසර තුළ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සඳහා පොලී ගෙවීම් අඩු විය. පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගිය බැවින් වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් ලෙස මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ වාර්තා වූ සියයට 29.7 සිට 2020 වසරේ දී සියයට 33.5ක් දක්වා ඉහළ ගියේය. තවද, රටෙහි විදේශීය ණය ප්‍රමාණයෙන් විශාල කොටසක් රජයේ විදේශීය ණය වන බැවින් 2020 වසරේ දී රජයේ ණය සේවාකරණ ගෙවීම්, මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයෙන් සියයට 90.7ක් විය.

## 5.8 විනිමය අනුපාතිකයේ හැසිරීම

**කොවිඩ්-19 වසංගතය රට තුළ ව්‍යාප්ත වීමට සහ ඒ හා සම්බන්ධ සමාජ හා ආර්ථික කටයුතු නවතා දැමීමට පෙරාතුව සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවති විනිමය අනුපාතිකය, 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් යන මාසයන්හි දී සහ 2020 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී සැලකිය යුතු පීඩනයකට ලක් විය.** 2020 වසරේ මාර්තු මැද සිට අප්‍රේල් මැද දක්වා පැවති අවප්‍රමාණය වීමේ පීඩනයක් සමඟ විනිමය අනුපාතිකය 2020 වසරේ අප්‍රේල් 9 වන දින එ.ජ. ඩොලරයට රුපියල් 199.75ක උපරිම අගයක් දක්වා ළඟා විය. මහ බැංකුව හා රජය විසින් 2020 වසරේ මාර්තු මැද සිට අත්‍යවශ්‍ය නොවන ආනයන සහ සමහර විදේශ විනිමය ගෙවීම් පාලනයට ගනු ලැබූ පියවර හැරුණු විට, එම කාලය තුළ පැවති අවප්‍රමාණය වීමේ පීඩනය හේතුවෙන් වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විදේශ විනිමය සැපයීම සහ වාණිජ බැංකු සමඟ විකුණුම්-ගෙවුම් හුවමාරු ගිවිසුම් සඳහා එළඹීම ඔස්සේ මහ බැංකුවට දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සක්‍රීය ලෙස මැදිහත් වීම අත්‍යවශ්‍ය විය. කෙසේ වුව ද, අප්‍රේල් මස මැද සිට මෙම තත්ත්වය වෙනස් වූ අතර, 2020 වසරේ නොවැම්බර් මාසය වන තෙක් විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතුණි. 2020 වසරේ නොවැම්බර් මාසය අවසානයේ සිට, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ හෙලීම හේතුවෙන් ඇති වූ සමපේක්ෂණ වෙළඳපොළ හැසිරීම සහ ආනයන ක්‍රමිකව ඉහළ යෑම හේතුවෙන්, විනිමය අනුපාතිකය මත පීඩනයක් ගොඩ නැගෙනු දක්නට ලැබුණු අතර, එමනිසා මහ බැංකුවට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය. ඒ අනුව, 2020 වසර අවසානය වන විට, රුපියල අවප්‍රමාණය වීම එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.6කට සීමා විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2020 වසර අවසානය වන විට රුපියල, යූරෝ මුදල් ඒකකයට (සියයට 11.2කින්), ජපන් යෙන්වලට (සියයට 7.5කින්) සහ ස්ටර්ලිං පවුමට (සියයට 6.2කින්) සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව නොවෙනස්ව පැවතුණි.

**අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක, එ.ජ. ඩොලරයට සාපේක්ෂව මිශ්‍ර හැසිරීම් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2020 වසර අවසානය වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව යූරෝ මුදල් ඒකකය (සියයට 9.8කින්), ජපන් යෙන් (සියයට 5.4කින්) සහ ස්ටර්ලිං පවුම (සියයට 3.9කින්) අතිප්‍රමාණය වූ අතර, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉන්දියානු රුපියල (සියයට 2.6කින්) අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් රැසකට සාපේක්ෂව අවප්‍රමාණය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී විශේෂ ගැණුම් හිමිකම්වලට සාපේක්ෂව සියයට 6.4කින් අවප්‍රමාණය විය.

### 5.8.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සෑදුම් ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ හැසිරීම් මනිනු ලබන සඵල විනිමය අනුපාතික දර්ශක මෙම වසර තුළ දී පහළ ගියේය.** ව්‍යවහාර මුදල් පැසෙහි ඇතුළත් එ.ජ. ඩොලරය සහ අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශකය පහළ ගියේය. ඒ අනුව, 2020 වසර තුළ දී, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සෑදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 5.3කින් සහ සියයට 4.2කින් පහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකාවේ

**5.14 රූප සටහන**
**විනිමය අනුපාතිකයේ වෙනස්වීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.14 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 |
| යූරෝ | 208.99 | 203.67 | 229.42 | 191.71 | 200.14 | 212.07 | 2.62 | -11.23 | -4.21 | -5.62 |
| ඉන්දියානු රුපියල් | 2.61 | 2.55 | 2.55 | 2.38 | 2.54 | 2.50 | 2.61 | 0.00 | -6.40 | 1.46 |
| ජපන් යෙන් | 1.65 | 1.67 | 1.81 | 1.47 | 1.64 | 1.74 | -1.02 | -7.54 | -10.36 | -5.65 |
| බ්‍රිතාන්‍ය පවුම් | 231.86 | 238.46 | 254.35 | 216.67 | 228.20 | 238.22 | -2.77 | -6.25 | -5.05 | -4.21 |
| එක්සත් ජනපද ඩොලර් | 182.75 | 181.63 | 186.41 | 162.54 | 178.78 | 185.52 | 0.61 | -2.56 | -9.08 | -3.64 |
| විශේෂ ගැනුම් හිමිකම් | 253.51 | 251.17 | 268.48 | 229.90 | 246.97 | 258.61 | 0.93 | -6.45 | -6.91 | -4.50 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2017 = 100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | |
| | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 85.81 | 86.74 | 83.12 | 94.05 | 88.17 | 85.93 | 1.09 | -4.17 | -6.28 | -2.54 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 87.81 | 90.74 | 89.49 | 95.45 | 90.42 | 91.36 | 3.33 | -1.37 | -5.31 | 1.05 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. ඍණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම/පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

විදේශීය තරඟකාරිත්වය පිළිබිඹු කෙරෙන පරිදි නාමික විනිමය අනුපාතිකවල වෙනස් වීමට අමතරව මුදල් පැසෙහි ඇතුළත් රටවල උද්ධමන වෙනස ද සැලකිල්ලට ගනිමින් ගණනය කෙරෙන, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක ද වසර තුළ දී, පිළිවෙළින්, සියයට 2.4කින් සහ සියයට 1.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, රටෙහි වෙළඳ තරඟකාරිත්වය පවත්වා ගැනීමට සහය වෙමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පදනම් වර්ෂයේ (2017=100) සීමාවට වඩා අඩු අගයක පැවතුණි.

**5.15 රූප සටහන**

**කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.8.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2020 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ ගනුදෙනු ප්‍රමාණය පහළ ගියේය.** ඒ අනුව, 2019 වසරේ එ.ජ. ඩොලර් මිලියන 19,377ක් ලෙස වාර්තා වූ අන්තර් බැංකු දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 18,408ක් දක්වා අඩු විය. 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,643ක් වූ එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 10,445ක් (මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 56.7ක්) දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. මීට ප්‍රතිවිරුද්ධව, 2019 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 7,734ක් වූ ඉදිරි වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 2020 වසරේ එ.ජ. ඩොලර් මිලියන 7,964ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුව 2020 වසරේ දී, ජාත්‍යන්තර සංචිත ගොඩනැංවීමේ අරමුණින්, ශුද්ධ පදනම මත, එ.ජ. ඩොලර් මිලියන 282.5ක් මිලදී ගනිමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සඳහා මැදිහත් විය. මෙය, එ.ජ. ඩොලර් මිලියන 685.4ක විදේශ විනිමය මිල දී ගැනීමෙහි සහ එ.ජ. ඩොලර් මිලියන 402.9ක සැපයීමෙහි ප්‍රතිඵලයක් විය.

5